**2020 නොවැම්බර් 24**
**2020 நவெம்பர் 24**
**24 November 2020**

# NAOSL

වාර්තාවේ අංකය : එස්පීආර්/2020/18
அறிக்கை இல. : எஸ்பீஆர்/2020/18
Report No : SPR/2020/18

## මඩකලපු පෞද්ගලික විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

## மட்டக்களப்பு தனியார் பல்கலைக்கழக கல்லூரியை ஸ்தாபித்தல் மற்றும் செயற்படுத்தல் நடைமுறை தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை

## Special Audit Report on the Process of Establishment and Maintenance of Private University College of Batticaloa

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



SPR/2020/18
මඩකලපු පෞද්ගලික විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
மட்டக்களப்பு தனியார் பல்கலைக்கழக கல்லூரியை ஸ்தாபித்தல் மற்றும் செயற்படுத்தல் நடைமுறை தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை
Special Audit Report on the Process of Establishment and Maintenance of Private University College of Batticaloa

Printed by Digital PRESS - NAOSL

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මඩකලපු පෞද්ගලික විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

# Special Audit Report on the Process of Establishment and Maintenance of Private University College of Batticaloa

மட்டக்களப்பு தனியார் பல்கலைக்கழக கல்லூரியை ஸ்தாபித்தல் மற்றும் செயற்படுத்தல் நடைமுறை தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | විධායක සාරාංශය---------------------------------------------------------------------- | 1-2 |
| 02 | වාර්තාවේ පසුබිම හා ස්වභාවය ----------------------------------------------------- | 2-3 |
| 03 | වාර්තාව පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදයන් --------------- | 3 |
| 04 | විගණන විෂය පථය ------------------------------------------------------------------ | 3 |
| 05 | විෂය පථයේ සීමාවන් -------------------------------------------------------------- | 4 |
| 06 | ආයතන අනන්‍යතාවය හඳුනාගැනීම ------------------------------------------------ | 4 |
| 07 | ක්‍රියාවලිය ------------------------------------------------------------------------ | 4 - 19 |
| 08 | විගණන නිරීක්ෂණ ------------------------------------------------------------------ | 20 - 40 |
| 09 | නිර්දේශ ------------------------------------------------------------------------ | 40 - 43 |
| 10 | දෙමළ පරිවර්ථනය ------------------------------------------------------------------ | 45-94 |
| 11 | ඉංග්‍රීසි පරිවර්ථනය -------------------------------------------------------------- | 95-139 |
| 13 | ඇමුණුම් ------------------------------------------------------------------------ | 141-544 |
| 14 | උපලේඛණ ---------------------------------------------------------------------- | 545-559 |

**මඩකලපු පෞද්ගලික විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව**

---

1. විධායක සාරාංශය

---

ශ්‍රී ලංකාව තුල ජාතික මට්ටමේ සාකච්ඡාවකට ලක්වී තිබූ මඩකලපුව පෞද්ගලික විශ්ව විද්‍යාල විද්‍යායතනය (බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම) ස්ථාපිත කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සිදු කෙරෙන විමර්ශන කටයුතු සඳහා සහාය වීම පිණිස විශේෂ විමර්ශනයක් සිදුකරන ලෙස ඉල්ලීමක් කර තිබිණි. ඒ අනුව විමර්ශන කටයුතු ආයතනික පැතිකඩ කිහිපයකින් සිදු කරන ලදි. නෛතික රාමු තුල උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය මූලිකාංග සම්පූර්ණ කර නොතිබූ බවට වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන තිබියදී, මඩකලපුව පෞද්ගලික විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත විධිමත් නෛතිකභාවයක් ඇති බව හැගවෙන පරිදි තරුණ කටයුතු අමාත්‍යාංශය හා පෞද්ගලික විද්‍යායතනය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගෙන තිබිණි. මහවැලි අධිකාරිය සතුවූ භූමියක් තුල මෙම විද්‍යායතනය ස්ථාපිත කර තිබූ අතර, රජය සතු ඉඩමක් පෞද්ගලික පරිහරණයට ලබාදීමේදී අනුගත විය යුතු අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් වී නොතිබූ අතර, නිසි නියාමනයක් නොතිබීම හේතුවෙන් පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කර නොතිබිණි. නීත්‍යානුකූලව බදු දී තිබූ භූමි ප්‍රමාණය අක්කර 35 ක් වුවත්, අනීතිකව භූමිය අක්කර 55 ක් දක්වා විද්‍යායතනය මගින් පරිහරණය කිරීමට කටයුතු කර ඇති බව අනාවරණය විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් නව ව්‍යාපෘතියක් නොවන පවතින ව්‍යාපෘතියක දිගුවක් ලෙස ආරම්භ කරන ව්‍යාපෘති සඳහා පහසුකම් නොසපයන බවට වූ කොන්දේසියට අනුකූල නොවන සේ උක්ත පෞද්ගලික විද්‍යායතනය ආයෝජන මණ්ඩල ව්‍යාපාතියක් ලෙස ලියාපදිංචි කර රුපියල් මිලියන 71 ක ආනයන තීරු බදු සහන ලබාදී තිබුණි. මහ බැංකු මාර්ගෝපදේශ හා නීතිරීතිවලට අනනුකූල වන සේ නිසි සැලකිලිමත්භාවයකින් තොරව ලංකා බැංකුව විසින් විද්‍යායතනය වෙත ලැබී තිබූ රුපියල් මිලියන 3,671 ක් පමණ වූ විදේශීය ප්‍රේෂණ ලැබීම් නිදහස් කිරීමට කටයුතු කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා රජයේ ඉඩම් ලබා දීමේ ක්‍රමවේදය හා නීත්‍යානුකූලභාවය, ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා අදාල පළාත් පාලන ආයතන මගින් අනුමැතිය ලබා දී ඇති ආකාරය, අදාල පාරිසරික අනුමැතීන්, උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාව තුල ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියා පිළිවෙත හා නීත්‍යානුකූලභාවය, බදු සහන ලබා ගැනීමේ අදහසින් අයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතියක් ලෙස ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය හා නෛතිකභාවය, එසේම ආමුක විදේශ ව්‍යවහාර මුදල් පිළිබඳ ප්‍රමානවත්

සුපරීක්ෂණයක් අදාල බලධාරී ආයතන මගින් සිදු කර ඇතිද යන්න හා මෙම පෞද්ගලික ආයතනය මගින් සමාජීය සෘණ බාහිරතා සිදු වී ඇතිද යන්න සහ සමගාමී වෙනත් කරුණු පරීක්ෂාවට භාජනය කෙරුණි.

රජයේ ඉඩම් වෙනුවෙන් නිසි අනුමැතියක් ලබා නොමැති අවස්ථාවක මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුමත කර තිබූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව හා ලංකා බැංකුව මෙම මහා පරිමාණ ආමුඛ විදේශ ව්‍යවහාර මුදල් සම්බන්දයෙන් නිසි සැලකිල්ලක් දක්වා නොතිබුණි. තවද මෙම පෞද්ගලික විශ්ව විද්‍යාල ආයතනය ස්ථාපිත කිරීමේදී අනුමැතීන් ලබාදුන් හා නියාමනයට ලක් කළ රාජ්‍ය ආයතන වෙනත් සමාන ආයතනයකට ලබා නොදෙන විශේෂ නැඹුරුතාවයකින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. එක් එක් ආයතනික රාමු උක්ත විෂය හා සම්බන්ධ කටයුතුවල නියැලීමේදී නෛතිකත්වයෙන් බැහැරවීම්, විනිවිදභාවයෙන් තොරව කටයුතු කිරීම් හා වගකීම් විරහිතව ක්‍රියාකිරීම පිළිබඳ විනය නීතිරීති හා සාමාන්‍ය නීතිරීති ප්‍රකාරව සිදුකළ යුතු ආයතනික කාර්යභාරය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම් වාර්තාවට ඇතුළත් කර ඇත.

2. වාර්තාවේ පසුබිම හා ස්වභාවය

-------------------------------------

ශ්‍රී ලංකාව තුල ජාතික මට්ටමේ සාකච්ඡාවකට ලක්වී තිබූ මඩකලපුව කැම්පස් පෞද්ගලික සමාගම ස්ථාපිත කිරීම පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සිදු කෙරෙන විමර්ශන කටයුතුවලට සහාය වීම සඳහා විශේෂ විමර්ශනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මා වෙතින් ඉල්ලීමක් කර තිබිණි.

ඒ අනුව සිදුකරන ලද පරීක්ෂණයන්ට අනුව හිරා පදනම නැමැති ආයතනයක් විසින් උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමේ අරමුණින් වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර, අවබෝධතා ගිවිසුමෙහි නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් නිරීක්ෂණය විය. තවද 2015 වර්ෂයේදී අවබෝධතා ගිවිසුමෙහි නම් සඳහන් ආයතනය විසින් උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය මූලික හර පද්ධතීන් සකස් කිරීමකින් තොරව තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය ලබා NVQ සහතික ප්‍රධානය කර තිබුණි. පසුව මහවැලි අධිකාරියෙන් දීර්ඝකාලීන බද්දට ඉඩමක් ලබාගෙන එහි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පහසුකම් සපයන ව්‍යාපෘතියක් ලෙස ලංකා බැංකුවේ මඩකලපුව කැම්පස් ලිමිටඩ් නමින් විවෘත කර ඇති බැංකු ගිණුමක් තුළින් ඉහළ අගයන්ගෙන් යුත් විදේශීය ආමුක ප්‍රේෂණයන් (Foreign Inward Remmitance) ලබාගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද මහවැලි අධිකාරිය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් පහසුකම් සැපයීමේදී නිසි ක්‍රමවේදයන් භාවිතා කර තිබූ බව සහ ආමුක ප්‍රේෂණ සම්බන්ධයෙන් විනිමය නීතිරීති ප්‍රකාරව කටයුතු කිරීමට ලංකා බැංකුව (අදාළ

බැංකුකරු) කටයුතු කර තිබූ බව නිරීක්ෂණය නොවිය. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී දායකත්වය හා නිර්දේශ ලබාදුන් උක්ත ආයතනයන්හි ක්‍රියාවලිය පරීක්ෂාවෙන් හඳුනාගන්නා ලද තොරතුරු ඇතුළත් කර මෙම වාර්තාව සකස් කරන ලදි.

3. වාර්තාව පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදයන්

------------------------------------------------------------------------

3.1. ලිපි ලේඛන පරීක්ෂාව

3.1.1 අදාළ අණ පනත් හා රජයේ ගැසට් ප්‍රකාශන පරිශීලනය කිරීම.

3.1.2 ආයතනික රීති හා ක්‍රමවේදයන් පරීක්ෂා කිරීම.

3.1.3 ව්‍යාපෘති සමාගම හා රාජ්‍ය ආයතන අතර වූ අවබෝධතා ගිවිසුම් පරීක්ෂාව

3.1.4 උක්ත විෂයට අදාළව සම්බන්ධිත රාජ්‍ය ආයතන පවත්වාගෙන ගොස් තිබූ ලිපිගොනු පරීක්ෂාව

3.1.5 ව්‍යාපාතිය ක්‍රියාත්මක කර ඇති භූමිය හා ව්‍යාපෘතිය තුළ වූ ඉදිකිරීම් වෙනුවෙන් අදාළ ආයතනවලින් ලබා දී තිබූ අනුමැතීන් පරීක්ෂාව

3.2 අනෙකුත් ක්‍රමවේදයන්

3.2.1 මඩකලපුව ප්‍රදේශයේ පිහිටි අදාළ ව්‍යාපෘති සමාගම භෞතිකව පරීක්ෂාව

3.2.2 ව්‍යාපෘති සමාගමේ හා සම්බන්ධිත ආයතනවල නිලධාරින් සමඟ සාකච්ඡා කිරීම හා ප්‍රකාශ ලබාගැනීම.

4. විගණන විෂයපථය (Audit Scope)

---------------------------------------

මහවැලි ඉඩමක් දීර්ඝකාලීන බදුදීමේ ක්‍රියාවලිය, ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය, පෞද්ගලික සමාගමක් වෙත උපාධි ප්‍රදානය වෙනුවෙන් අවසර දීම සඳහා යොදාගන්නා ඇගයීම් නිර්ණායක, වෘත්තිය පුහුණු අමාත්‍යාංශය හා තෘතික හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාව NVQ පාඨමාලා සඳහා ආයතන ලියාපදිංචි කර ගැනීමේ ක්‍රමවේදයන්, මෙවැනි ව්‍යාපෘතියක් වෙනුවෙන් අදාළ පළාත් පාලන ආයතනයන්ගෙන් ලබාගත යුතු නිෂ්කාශනයන් මෙන්ම ආමුක ප්‍රේෂණයන් සම්බන්ධයෙන් බැංකුකරුවෙකු ක්‍රියා කළ යුතු ආකාරය පරික්ෂාව යන ක්ෂේත්‍රයන් වාර්තාවේ විගණන විෂයපථය ලෙස හඳුනාගන්නා ලදි.

5. විෂය පථයේ සීමාවන් (Limitation)

-----------------------------------------

5.1. පරීක්ෂාවට ලක් කෙරෙන ආයතනය පෞද්ගලික සමාගමක් බැවින් විගණකාධිපතිවරයාට එහි පොත් පත් පරීක්ෂා කිරීම හා භෞතික ප්‍රවේශය සීමාකාරී වීම.

5.2. මුදල් විශුද්ධිකරණ පනත යටතේ සිදු කළ යුතු පූර්ණ පරීක්ෂාවන් සඳහා නෛතික ප්‍රතිපාදන හා ප්‍රවේශයීය බාධා පැවැතීම.

6. ආයතන අනන්‍යතාවය හඳුනාගැනීම.

-------------------------------------------

විෂයගත විශ්ව විද්‍යාලය 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විවිධ අවස්ථාවලදී විවිධ නම්වලින් හඳුන්වා තිබුණි. එබැවින් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය, මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම, මඩකලපුව කැම්පස් සමාගම, විද්‍යායතනය හෝ විශ්ව විද්‍යාලය ලෙස විගණන වාර්තාව හා ඇමුණුම් තුළ දක්වා ඇති යෙදුම් එකම ආයතනයක් සඳහා වේ.

7. ක්‍රියාවලිය

--------------

7.1 වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් බැටික්ලෝ යුනිවර්සිටි කොලේජ් (පුද්ගලික) සමාගම වෙත වෘත්තීය අධ්‍යාපනයට අනුමැතිය ලබාගැනීම.

--------------------------------------------------------------------------------------------------------

පසුබිම් තොරතුරු

---------------------

7.1.1 හිරා වෘත්තීය අධ්‍යාපන ආයතනය නමින් වෘත්තීය පුහුණු ආයතනයක් ලියාපදිංචි කර ගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත හිරා පදනම මගින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයකට ප්‍රතිචාරීව වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 මාර්තු 21 දාතමින් යුත් අංක TVEC/4/5/3 දරන ලිපිය මගින් හිරා වෘත්තීය අධ්‍යාපන ආයතනය සිය කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව දන්වමින් හිරා පදනමේ ලේකම්වරයා වෙත ලිපියක් නිකුත් කර තිබුණි. (ඇමුණුම -01) කෙසේ නමුත් උක්ත අයදුම්පත්‍රය අංක TVEC/4/5/3 දරන ලිපිගොනුව තුළ ඇතුළත්ව නොතිබූ අතර, 2013 මැයි 20 දින එවකට ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයෙකුව සිටි ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය (බැටික්ලෝ කැම්පස් කොලේජ්) නමින් වෘත්තීය පුහුණු ආයතනයක් ලියාපදිංචිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයක් පමණක් ලිපිගොනුව තුළ ඇතුළත් වී තිබුණි. (ඇමුණුම - 02)

7.1.2 වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ TVEC/4/5/3 ලිපිය මගින් පාඨමාලා අන්තර්ගතය සඳහන් කර නොමැති බවත්, පූර්ව ලියාපදිංචියට පෙර එම පාඨමාලා විස්තර ඉදිරිපත් කරන ලෙස හිරා පදනමට දන්වා තිබුණි. පසුව 2013 අප්‍රේල් 13 දිනැතිව එවකට ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් තමා හිරා පදනමේ සභාපතිවරයා බවත්, හිරා පදනම මගින් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා වෘත්තීය අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමට තමා අදහස් කරන බවත්, එබැවින් ඊට අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලමින් එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙත ලිපියක් නිකුත් කර තිබූ අතර එම ලිපිය තුළ කෙටි සටහනක් යොදමින් 2013 මැයි මස 02 දින තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී ඇති බව නිරීක්ෂණය විය. (ඇමුණුම -03)

7.1.3 ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතාගේ ඉල්ලීමට ප්‍රතිචාරීව තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා හිරා පදනම වෙත වෘත්තීය අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම සඳහා අවසර ලබාදෙමින් 2013 අගෝස්තු 15 දින සිට 2016 අගෝස්තු 15 දින දක්වා බලාත්මක වන පරිදි වසර 03 ක අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.එම ගිවිසුම සඳහා හිරා පදනමේ සභාපති හිස්බුල්ලා මහතා හා එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා, තාක්ෂණික විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා හා මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයේ අධ්‍යක්ෂක විසින් 2013 ජූනි 11 වැනි දින අත්සන් තබා තිබුණි. (ඇමුණුම -04)

7.1.4 අවබෝධතා ගිවිසුමෙහි එක් එක් පාර්ශ්වයන් ඉටු කළ යුතු වගකීම් හා පොදු වගකීම් පහත පරිදි විය.

පළමු පක්ෂය වන වෘත්තීය පුහුණු නිපුණතා අමාත්‍යාංශයේ වගකීම්

---------------------------------------------------------------------------

- මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙහි පාලක සභාව (Govering Body) සඳහා නියෝජිතයන් දෙදෙනෙකු පත් කිරීම.

- පුහුණුව සඳහා අවශ්‍ය සම්පත්, තත්ත්ව ප්‍රමිතීන්, චක්‍රලේඛ, උපදෙස් ලබාදිම.

- වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය හරහා පාඨමාලාවන් ප්‍රතීතනය කිරීම හා තත්ත්ව සහතික ලබාදීම.

- මඩකලපුව විශ්ව විද්‍යාලයෙහි ඩිප්ලෝමාධාරීන් වෙනුවෙන් තාක්ෂණික විශ්ව විද්‍යාලය මගින් උපාධි පාඨමාලා නිර්මාණය කිරීම.

දෙවන පාර්ශ්වය ලෙස හිරා පදනමෙහි වගකීම්

------------------------------------------------------

- රාජ්‍ය හා පෞද්ගලික සහභාගීත්ව ව්‍යාපාරයක් ලෙස මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කිරිම.

- මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙහි පාලක සභාව වෙත නියෝජිතයන් දෙදෙනෙකු පත් කිරීම.

- යන්ත්‍රසූත්‍ර, උපකරණ, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම.

- වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය අනුමත වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම.

- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුකරන ක්‍රමක අධීක්ෂණ යාන්ත්‍රණය සඳහා සහාය දැක්වීම.

පොදු වගකීම්

---------------

- උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය හා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය අතර ගිවිසුමක් ඇති කර ගැනිම.

- ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ජීවත්වන තාරුණ්‍යයට සියළු පාඨමාලා විවෘතව තිබිය යුතු බව.

- විභාග පැවැත්වීම, පරීක්ෂණයන්, ඇගයීම් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය හා මඩකලපුව විශ්ව විද්‍යාලය එකඟතාවයෙන් සිදුකළ යුතු බව.

7.1.5 අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව 2013 ජූනි 18 දින තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හිරා පදනම ස්ථාපිත කිරීමට යෝජිත මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත ජාතික වෘත්තීය සහතික (NVQ) ප්‍රදානය කිරීමේ පාඨමාලා පවත්වාගෙන යාමට අවශ්‍ය හැකියාවන් පවතීද යන්න පරීක්ෂා කර බැලීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණි. (ඇමුණුම -05)

7.1.6 යෝජිත වෘත්තීය අධ්‍යාපන ආයතනයේ භාවිතයට යෝජිත ගොඩනැගිලි බිම් ප්‍රමාණය හා ඉඩම් ප්‍රමාණය, ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය හා පිරිමි ළමුන් සඳහා පමණක් වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට යෝජිතව තිබීම සම්බන්ධයෙන් වූ ගැටළු සහගතභාවය 2013 ජූනි 24 දින තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ ත්‍රිපුද්ගල කමිටු වාර්තාව මගින් (ඇමුණුම - 06) පෙන්වා දී තිබුණි.

7.1.7 පිරිමි ළමුන් බඳවාගැනීම සම්බන්ධයෙන් වූ ගැටළු සහගතභාවය පමණක් නිවැරදි කර අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට වෘත්තීය අධ්‍යාපනය ලබාගැනීමට හැකිවන පරිදි වෘත්තීය පාඨමාලාවලට බඳවාගන්නා බව තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හිරා පදනමේ සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2013 ජුලි 02 දිනැති ලිපියක් මගින් (ඇමුණුම - 07) දැනුම් දී තිබුණි.

7.1.8 2013 අගෝස්තු 01 දින හිරා පදනමේ සභාපතිවරයාගේ ඉල්ලීමට (ඇමුණුම - 08) ප්‍රතිචාරීව 2016 සැප්තැම්බර් මස ඩේලි මිලර් පුවත්පතේ පුවත්පත් දැන්වීම් මගින් සිසුන් බඳවා ගැනීම සඳහා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය 2013 අගෝස්තු 05 දින ලබා දී තිබුණි. (ඇමුණුම - 09)

7.1.9 NVQ පාඨමාලා සඳහා රු.216,000 ක පාඨමාලා ගාස්තු අයකිරීමට අනුමැතිය ලබාදෙන ලෙස හිරා පදනමේ සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2013 අගෝස්තු 01 දින ඉල්ලා ඇතත්, තරුණ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කර අවබෝධතා ගිවිසුම අනුව කටයුතු කරන ලෙසත්, ගාස්තු අයකිරිමට අවශ්‍ය නම් අවබෝධතා ගිවිසුම සංශෝධනය කරවා ගන්නා ලෙසත් දැනුම් දී තිබුණි. ඒ අනුව 2013 ඔක්තෝබර් 29 දින ගාස්තු අයකළ හැකිවන පරිදි අවබෝධතා ගිවිසුම සංශෝධනය කර දෙන ලෙස ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් තරුණ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් (ඇමුණුම - 10) කර ඇතත්, ලේකම්වරයා විසින් ඊට ප්‍රතිචාර දක්වා ඇති බව නිරීක්ෂණය නොවුණි.

7.1.10 ගාස්තු අය කරමින් පාඨමාලා පැවැත්වීමේ අවස්ථාව මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත ලබාදීමට හා පාඨමාලාවලට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 5% කට පූර්ණ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට හැකිවන පරිදි 2014 පෙබරවාරි 10 දින සිට බලාත්මක වන පරිදි අවබෝධතා ගිවිසුමෙහි 3 (V) වගන්තිය 2014 මැයි මස 13 වැනි දින සංශෝධනය කර තිබුණි. (ඇමුණුම - 11)

7.1.11 2014 මැයි 13 දින මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය නිල වශයෙන් විවෘත කර තිබුණි.(ඇමුණුම -12)

7.1.12 හබරණ මඩකලපුව ප්‍රධාන පාරේ පුනානි නගරයෙහි පිහිටි ගොඩනැගිල්ලක මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය නමින් නාම පුවරුවක් සවිකර ඇති බවත්, නැගෙනහිර විශ්ව විද්‍යාලය 1981 සිට 1988 දක්වා ඉහත නමින් ක්‍රියාත්මක වූ බැවින් මෙලෙස නැගෙනහිර විශ්ව විද්‍යාලය පෙර හැඳින්වූ නමින් වෙනත් ආයතනයක් කටයුතු කිරීමෙන් නැගෙනහිර විශ්ව විද්‍යාලය සමඟ ඇති සම්බන්ධතාවයක් පිළිබඳ නීතිමය ඇඟවීමක් ඇති විය හැකි බැවින් අවශ්‍ය කටයුතු කරන ලෙස නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උපකුලපති විසින් 2014 ජූනි 05 වැනි දින එවකට වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙත (ඇමුණුම -13) දන්වා යවා තිබුණි.

7.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම වෙත (හිරා පදනම වෙත) ඉඩම් නිදහස් කිරීම.

---

පසුබිම් තොරතුරු

---

7.2.1 ඉංජිනේරු පාඨමාලා පැවැත්වීම සඳහා වෘත්තිය පුහුණු ආයතනයක් පිහිටුවීම වෙනුවෙන් මහවැලි ඉඩම් අක්කර 35 ක් ලබාදෙන ලෙස ඉල්ලමින් එම්.ඒ.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2013 මැයි 02 දින සිය ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධූරයේ නිල මුද්‍රාව භාවිතා කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම - 14)

7.2.2 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තු කැඩැස්තර සිතියම් අංක 270016 තුළ කැබලි අංක 800, 804, 808 හා 812 ලෙස දක්වා ඇති වපසරිය අක්කර 35 ක් වන ජයන්ති යාය, වාලච්චේන, මඩකලපුව තුළ පිහිටි මහවැලි අධිකාරියට අයත් ඉඩම 2013 අගෝස්තු 19 දින මහවැලි බී කලාපයේ අසේලපුර කොට්ඨාශ කළමනාකරු විසින් වාර්ෂික බලපත්‍ර මගින් ශ්‍රී ලංකා හිරා පදනම වෙත බදු දී තිබුණු අතර 2017 වර්ෂයේ දෙසැම්බර් දක්වා වාර්ෂික බලපත්‍ර අලුත් කර තිබුණි. (ඇමුණුම - 15)

7.2.3 මහවැලි බී කලාපය වැලිකන්ද නියෝජ්‍ය නේවාසික කළමනාකරු (ඉඩම්) විසින් 2016 ඔක්තෝබර් 03 දිනැති ලිපියක් මගින්(ඇමුණුම - **16**) හිරා පදනම වෙත වාර්ෂික බදු පදනමින් ලබාදී තිබු උක්ත ඉඩම් කැබලි 04 සම්බන්ධයෙන් වූ පරිපූරක ලේඛනයෙහි ඉඩම් පරිහරණය

සම්බන්ධයෙන් වූ තීරුවෙහි දක්වා තිබූ "කුඹුරු ඉඩම්" යන්න වෙනුවට "වෙනත්" යන්න සඳහන් කරමින් "හිරා පදනම වෙත දිර්ඝකාලින බදුකරයක් ලබාදීම" යනුවෙන් සංශෝධනය කර සංශෝධිත පරිපූරක ලේඛනයක් සකස් කර දෙන ලෙස කර තිබූ ඉල්ලීමට ප්‍රතිචාරීව 2016 නොවැම්බර් 25 දින ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි - මඩකලපුව විසින් පරිපූරක ලේඛනය සංශෝධනය කර තිබුණි. (ඇමුණුම - **17**)

7.2.4 මහවැලි අධිකාරිය විසින් වාර්ෂික බදු පදනමින් "හිරා පදනම" වෙත ලබාදී තිබූ උක්ත ඉඩම් කැබලි හිරා පදනම විසින් සංස්ථාගත කරන ලද "බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම" නමින් වෙනස් කර ලබාදෙන ලෙස 2016 ඔක්තෝබර් 17 දින හිරා පදනමේ සභාපතිවරයා විසින් කරන ලද ඉල්ලීමට (ඇමුණුම - **18**) ප්‍රතිචාරීව අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් 2016 නොවැම්බර් 09 දිනැති ලිපියක් මගින් (ඇමුණුම - **19**) මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය ඊට අනුමැතිය ලබාදුන් බව දන්වා යවා තිබුණි.

7.2.5 මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්) ගේ අත්සනින් හා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත 2017 සැප්තැම්බර් 29 දිනැතිව අක්කර 35 ක වපසරියකින් යුක්ත පූර්වෝක්ත ඉඩම් කැබලි 04 බැටික්ලෝ කැම්පස් පෞද්ගලික සමාගම වෙත දීර්ඝ කාලීන බදු දීමට ඉදිරිපත් කර තිබූ ඉල්ලීම 2017 දෙසැම්බර් 08 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිර්දේශ කර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාදී තිබුණි. (ඇමුණුම - **20**)

7.2.6 වාර්ෂික බලපත්‍ර පදනමින් 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා හිරා පදනම වෙත ලබාදී තිබූ උක්ත ඉඩම් කැබලි 04, 2018 පෙබරවාරි 01 දින දීර්ඝකාලීන බදු ඔප්පුවක් මත 2013 ජුලි 12 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ 30 ක කාලයකට බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම වෙත බදුදී තිබුණි. (ඇමුණුම - 2**1**)

7.2.7 හිරා පදනමේ සභාපතිවරයා විසින් 2017 මාර්තු 15 දිනැති ලිපියක් මගින් (ඇමුණුම - 2**2**)යෝජිත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් වෙත නේවාසික පහසුකම් සැපයීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් දීර්ඝකාලීන බද්දට ගත් ඉඩම් අක්කර 35 ට යාබදව තවත් අක්කර 45 ක ඉඩමක් දීර්ඝකාලීන බද්දට ලබාගැනීම සඳහා මහවැලි අධිකාරිය වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි.

7.2.8 උක්ත ඉල්ලුම්පත්‍රය 2017 අප්‍රේල් 25 වැනි දින පැවති මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති අතර(ඇමුණුම - **23**), එම අනුමැතිය ද සමඟ

2017 අප්‍රේල් 18 දිනැති ලිපියක් මගින්(ඇමුණුම -24) මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහවැලි විෂයභාර අමාත්‍යවරයාට යොමුකර ඒ සඳහා ඔහුගේ අනුමැතිය ලබාගෙන තිබුණි.

7.3 මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ගිවිසුම්ගත වීම.

---

පසුබිම් තොරතුරු

---

7.3.1 ශ්‍රී ලංකා හිරා පදනමේ සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2015 ජූනි 12 දින ආයෝජන මණ්ඩල නව ව්‍යාපෘතියක් ලෙස මඩකලපුව ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතනයක් ආරම්භ කිරිමට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම -25)

එම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර තිබූ ආවරණ ලිපිය හා මූල්‍ය සැලසුම අනුව(ඇමුණුම - 26) ඒ සඳහා අක්කර 50 ක මහවැලි ඉඩමක් බදු පදනමින් අත්පත් කරගෙන ඇති බව හා එම ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො. මිලියන 40.2 ක විදේශිය ආයෝජන හා එ.ජ.ඩො. මිලියන 5.55 ක දේශීය ආයෝජන සිදුකිරීමට අපේක්ෂිත බව සඳහන් කර තිබුණි.

7.3.2 ආයෝජන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක (ආයෝජන ඇගයීම්) විසින් එහි විධායක අධ්‍යක්ෂක (ආයෝජන ඇගයිම් හා ප්‍රවර්ධන) වෙත 2015 ජූනි 23 දින උක්ත අයදුම්පත්‍රය පිළිබඳ පහත නිර්දේශයන් ඇතුළත් අභ්‍යන්තර මැමෝ පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම - 27)

(I) ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම අවම වශයෙන් වර්ෂ 30 ක කාලයක් සඳහා බද්දට ගත යුතු බව.

(II) විදේශිය ආයෝජන මාර්ග වේ නම් පූර්ණ මූල්‍ය සැලසුම් සමඟ හෙළිදරව් කළ යුතු බව.

(III) ව්‍යාපෘතිය, නව ව්‍යාපෘතියක් විය යුතු බව හා වර්ෂ 3 ක් තුළ අවසන් කළ යුතු බව.

(IV) යෝජිත පාඨමාලා අතර වූ සංචාරක හා සෞඛ්‍ය අධ්‍යාපනය යන පාඨමාලාවලට අදාළ විස්තර ඉදිරිපත් කළ යුතු බව.

(V) ආයෝජන සැලසුම් හා විස්තරාත්මක ඉදිකිරීමේ සැලසුම, අදියරයන් සමඟ ඉදිරිපත් කළ යුතු බව.

(VI) ඉහත සංශෝධනයන් සමඟ ඔබ එකඟවන්නේ නම් ආයෝජකයාගෙන් සංශෝධිත අයදුම්පත්‍රයක් ලබාගත හැකි බව.

7.3.3 බැටික්ලෝ කැම්පස් කොලේජ් පෞද්ගලික සමාගමේ සභාපතිවරයා ලෙස ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස මඩකලපුව ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම සඳහා ආයෝජන මණ්ඩලය වෙත 2015 ජූලි 17 දින තවත් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම - **28**) එම අයදුම්පත්‍රය අනුව සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 95 ක් හිරා පදනමටත්, ඉතිරි සියයට 05 හිරාස් හිස්බුල්ලා යන අයටත් අයත් බව දන්වා තිබුණි. තවද මුළු ප්‍රාග්ධනය වූ එ.ජ.ඩො. මිලියන 4.75 ක් ලෙසද, එ.ජ.ඩො. මිලියන 3.2 ක් විදේශ ආයෝජන ලෙස සහ ඉතිරි එ.ජ.ඩො.මිලියන 1.55 දේශීය අරමුදලිනුත් ආයෝජනය කිරීමට නියමිත බව එහි සඳහන් විය.

7.3.4 එම අයදුම්පත්‍ර ලැබුණු 2015 ජූලි 17 දිනයේදීම, ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයා විසින් හිස්බුල්ලා මහතා වෙත ලිපියක් නිකුත් කරමින් (ඇමුණුම - **29**) අයදුම්පත්‍රය නිරීක්ෂණ හා නිර්දේශ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බවත්, නිරීක්ෂණ ලද පසුව ආයෝජන මණ්ඩල ඇගයීම් සඳහා යොමු කරන බවත් , පසුව විධිමත් ලිපියක් මගින් අනුමැතිය ලබාදීමට කටයුතු කරන බවත්, එතෙක් යෝජිත සමාගම සංස්ථාගත කිරීමට අදාළ කටයුතු කළ හැකි බවත් සංස්ථාගත කිරීමට පෙර එහි සංගමික ව්‍යවස්ථාවලිය ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ (නීති) මගින් අනුමත කරගත යුතු බවත් දන්වා තිබුණි.

7.3.5 සහකාර අධ්‍යක්ෂක (ආයෝජන ඇගයීම්) විසින් ඇමුණුම - 28 හි දැක්වෙන 2 වන අයදුම්පත්‍රය ඇගයීමට ලක්කර විධායක අධ්‍යක්ෂ (ආයෝජන ඇගයීම්) වෙත අභ්‍යන්තර මැමෝ පත්‍රයක් මගින් පහත නිර්දේශයන් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම - 30)

(I) ව්‍යාපෘතිය සඳහා වර්ෂ 05 ක බදු සහන කාලසීමාවක් ලබාදිය යුතු බව.

(II) ව්‍යාපෘතිය හා සම්බන්ධ භාණ්ඩ ආනයනය සඳහා වර්ෂ 02 ක බදු නිදහස් කාලයක් ලබාදිය යුතු බව.

(III) සමාගම, විනිමය පාලනය පනතට යටත් විය යුතු බව

(IV) සමාගමේ වාණිජ මෙහෙයුම්, ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී වර්ෂයක් තුළ ආරම්භ කළ යුතු බව.

7.3.6 ආයෝජන මණ්ඩලයෙහි විධායක අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ 2015 අගෝස්තු 03 දින දරන ලිපිය මඟින් (ඇමුණුම - **31**) අදාළ අයදුම්පත්‍රය, යෝජිත සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලිය සහ ලියාපදිංචියට අදාළ අනෙකුත් තොරතුරු උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ හා නිෂ්කාශන සඳහා ඉදිරිපත් කර තිබුණි.

7.3.7 බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි උපාධි ප්‍රධානය සම්බන්ධයෙන් වගන්ති ඇතුළත් නොවන බැවින් හා ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයෙහි පුහුණු ආයතනයක් සඳහා ව්‍යාපෘතියක් ලෙස දක්වා තිබීම හේතුවෙන් උක්ත ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශ විෂයට අයත් නොවන බව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2015 නොවැම්බර් 18 දින ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා යවා තිබුණි. (ඇමුණුම - **32**)

7.3.8 බැටික්ලෝ කැම්පස් කොලේජ් හි සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2015 දෙසැම්බර් 14 දින ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ ලිපියක් මගින්(ඇමුණුම - **33**) හිරා පදනම විසින් තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මත දැනට උසස් ඩිප්ලෝමා සහතික නිකුත් කරනු ලබන "බැටික්ලෝ කැම්පස් කොලේජ්" නමින් උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යන බවත්, එමගින් උපාධි පාඨමාලා පවත්වාගෙන යාම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ අවසරය ඉල්ලා ඇති බවත්, උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් ආසන්න වශයෙන් ඩොලර් මිලියන 50 ක් වැය කිරීමට බලාපොරොත්තු වන බවත්, ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් දැනටමත් ආරම්භ කර ඇති බවත් දක්වමින් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා තිබුණි.

7.3.9 ඇමරිකන් ඩොලර් මිලියන 4.75 ක ආයෝජනයක් සහිතව උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා 2015 ජූලි 17 දිනැතිව ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රයට ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබාදුන් බව එහි විධායක අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ 2016 ජනවාරි 12 දිනැති ලිපිය මගින් (ඇමුණුම - 34) හිරා පදනමේ සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා වෙත දන්වා යවා තිබුණි.

7.3.10 උපාධි ප්‍රදානය කිරීමේ පහසුකම සහිත උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම හා උපාධි ප්‍රදානය සඳහා දේශිය හා විදේශිය විශ්ව විද්‍යාල සමඟ අනුබද්ධ වී කටයුතු කිරීම ඇතුළත් කරමින් බැටික්ලෝ කැම්පස් (පුද්ගලික) සමාගමෙහි අරමුණු වෙනස් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා බැටික්ලෝ කැම්පස් (පෞද්ගලික) සමාගමේ සභාපති ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින්

ආයෝජන මණ්ඩල විධායක අධ්‍යක්ෂවරයා වෙත2016 මැයි 17 දින ලිපියක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම -35)

7.3.11 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් උක්ත ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදෙමින් බැටික්ලෝ කැම්පස් (පුද්ගලික) සමාගම සමඟ 2016 මැයි 19 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. (ඇමුණුම - 36)

7.3.12 බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගමේ සභාපතිවරයා විසින් සමාගමේ අරමුණු වෙනස් කිරීම සඳහා කර තිබූ ඉල්ලීමට සබැඳිව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විරෝධතාවයක් පවතින්නේද යන්න විමසමින් 2016 ජූනි 02 දින ආයෝජන මණ්ඩල විධායක අධ්‍යක්ෂවරයා විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශ අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) වෙත ලිපියක් යවා තිබුණි. (ඇමුණුම - **37**)

7.3.13 උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) ගේ 2016 සැප්තැම්බර් 30 දිනැති ලිපිය මගින් (ඇමුණුම - **38**) උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය හැර සඳහන් කර තිබූ අනෙකුත් සංශෝධනයන් වෙනුවෙන් එකඟතාවය ලබාදී තිබුණි.

7.3.14 ආයෝජන මණ්ඩල විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැති) විසින් 2016 ඔක්තෝබර් 18 දිනැති ලිපියක් මගින් ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේදී අනුගත විය යුතු කොන්දේසි හා ලබාගත යුතු අනුමැතින් ඇතුළත් කරමින් හිරා පදනමේ කළමනාකරණ අධ්‍යක්ෂ වෙත ලිපියක් නිකුත් කර තිබුණි. (ඇමුණුම - **39**)

7.4 ලංකා බැංකුවේ ඉතුරුම් ගිණුම් හරහා බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම හා ඊට අනුබද්ධ ආයතන වෙත ලද මුදල් ප්‍රේෂණයන් ලැබීම.

---

පසුබිම් තොරතුරු

---

7.4.1 බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගම නමින් හා ඊට අනුබද්ධිත ආයතන නමින් ලංකා බැංකුවේ විවිධ ශාඛාවන්හි බැංකු ගිණුම් 14 ක් පවත්වාගෙන ගොස් තිබුණි. විස්තර උපලේඛන අංක 01 හි දැක්වේ.

7.4.2 ඉහත ගිණුම් අතරින් බැංකු ගිණුම් 04 ක් වෙත 2016 -2017 වර්ෂයන්හිදී එකතු වටිනාකම රු.4,123,859,831 ක විදේශීය ප්‍රේෂණ ලැබී තිබුණි. විස්තර පහත පරිදි වේ.

වගු අංක 01- බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගම හා ඊට අනුබද්ධිත ආයතන නමින් ඇති බැංකු ගිණුම් සඳහා ලද ප්‍රේෂණ 2016- 2017

| ගිණුම් අංකය | ගිණුම්හිමියා | ලද විදේශීය ප්‍රේෂණයන්හි වටිනාකම |
| --- | --- | --- |
| | | රු. |
| 1631952 | ශ්‍රී ලංකා හිරා පදනම | 313,128,281 |
| 78495137 | බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගම | 3,640,939,488 |
| 80961953 | ඒ.එම්.ඒ.ලංකා පුද්ගලික සමාගම | 144,978,158 |
| 74791337 | මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය | 24,849,903 |
| | | 4,123,895,831 |

එක් එක් බැංකු ගිණුම වෙත ලද ප්‍රේෂණ සම්බන්ධ විස්තර උපලේඛන අංක 02 දැක්වේ.

7.4.3 උක්ත විදේශීය ප්‍රේෂණයන් ලද බැංකු ගිණුම් ආරම්භ කිරිම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර ලැබීමෙන් පසුව 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අවශ්‍යතාවය මත බැංකුව විසින් පිළියෙල කරනු ලබන ගනුදෙනුකරු හඳුනාගැනීමේ පත්‍රිකාවන්හි ඇතුළත් වි ඇති තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 02- ගනුදෙනු හඳුනාගැනීමේ පත්‍රිකාවේ ඇතුළත් වී ඇති තොරතුරු

| ගිණුම් අංකය | ගිණුමේ නම | ගිණුමේ අරමුණ | අරමුදල් ගලායන මාර්ග | අපේක්ෂිත මාසික සාමාන්‍ය තැන්පතු වටිනාකම | ධනය බිහිවූ ආකාරය | අවධාන මේ ස්වභාවය | දේශපාලන සම්බන්දතාවයක් ඇත්ද යන වග (ඇමුණුම - 40 හා 41) |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | රු. | | | |
| 78495137 | බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගම | ව්‍යාපාර ගනුදෙනු | වෙනත් (විදේශීය ප්‍රේෂණ) | මිලියන 10 ට වැඩි | විදේශීය ප්‍රේෂණ හා ව්‍යාපාර ආදායම් | උපරිම | සමාගමේ සභාපති එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 74791337 | මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය | සමාජ හා පුණ්‍ය කටයුතු | විදේශීය ආධාර හෝ පුණ්‍යාධාර | 500,000 - මිලියන 01 අතර | වෘත්තීය හෝ රැකියාව මගින් | සළකුණු කර නැත. | සමාගමේ සභාපති එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හා නියෝජ්‍ය අමාත්‍යවරයෙකි. |

**7.5** මඩකලපුව විශ්ව විද්‍යාලය වෙත උපාධි ප්‍රදානය කිරීමේ හැකියාව ලබාගැනීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ වූ ගණුදෙනු
---------------------------------------------------------------------------------------------
පසුබිම් තොරතුරු
-------------------

7.5.1 මඩකලපුව විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සභාපති,ඒ.එම්.එල්.එම්.හිස්බුල්ලා මහතා විසින් 2015 ජූලි 03 පාර්ලිමේන්තු ලිපි ශීර්ෂයක් උපයෝගි කරගනිමින් සිය විද්‍යායතනය වෙත උපාධි පිරිනැමීමේ අවසර ලබාදෙන ලෙස එවකට උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කර තිබුණි. (ඇමුණුම - **42**)

7.5.2 උක්ත ඉල්ලීම සලකා බැලීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත රු.මිලියන 01 ක් ගෙවන ලෙසත්, උපාධි පිරිනැමීම සඳහා වූ සුදුසුකම් හා පාඨමාලා විස්තර ඇතුළත් සම්පූර්ණ ලිපිගොනු පිටපත් 6 ක් අමාත්‍යාංශය වෙත ලබාදෙන ලෙසත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් 2015 ජූලි 07 දින මඩකලපුව විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සභාපතිවරයා වෙත දන්වා යවා තිබුණි. (ඇමුණුම - 43)

7.5.3 මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය විසින් 2015 ජූලි 07 දින උක්ත ගාස්තුව උසස් අධ්‍යාපන අමත්‍යාංශය වෙත ගෙවා තිබුණි.(ඇමුණුම - 44)

7.5.4 උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින් එකී විද්‍යායතනයේ ආයතනික සමාලෝචනය සිදු කිරීම සඳහා 2015 සැප්තැම්බර් 22 දින පත්කරන ලද (ඇමුණුම - 45) පංච පුද්ගල කමිටුව 2016 ජනවාරි 06 , 07 හා 08 යන දිනවල විද්‍යායතනය භෞතිකව පරීක්ෂා කිරීමෙන් හා ඊට අදාළ ලිපිගොනු පරීක්ෂාවෙන් පසු සිය සමාලෝචන වාර්තාව 2016 පෙබරවාරි 19 දින අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. (ඇමුණුම - 46 හා 47)

7.5.5 අමාත්‍යාංශ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන අංශයේ අතිරේක ලේකම්වරයා විසින් ඉහත සමාලෝචන වාර්තාව තුළ වූ නිර්දේශ තවදුරටත් වැඩි දියුණු කර දෙවන ආයතනික සමාලෝචන කමිටුව වෙත යොමුකරන ලෙස දන්වමින් විද්‍යායතන සභාපතිවරයා වෙත 2016මාර්තු 15 දිනැති ලිපියක් මඟින් දන්වා තිබුණි. (ඇමුණුම - 48)

7.5.6 උක්ත ආයතනික සමාලෝචන කමිටුව විසින් 2017 පෙබරවාරි 02 දින සිට මාර්තු 01 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ භෞතික පරීක්ෂාවක් සමගින් මඩකලපුව විශ්ව විද්‍යාලයේ ලිපිගොනුව විමර්ශනය කර 2017 ජූලි 01 දින දෙවැනි ආයතනික සමාලෝචන වාර්තාව අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. (ඇමුණුම - 49)

**7.5.7** උක්ත දෙවන වාර්තාව අමාත්‍යාංශය වෙත ලැබීමෙන් පසුව එය ප්‍රතීතන හා තත්ත්ව සහතිකය පිළිබඳ ස්ථාවර කමිටුව වෙත යොමුකර තිබූ අතර, එම කමිටුව විසින් වාර්තාවේ සඳහන් කරුණු සොයාබැලීම සඳහා තාක්ෂණික උපදේශන කමිටුවක් වෙත යොමුකර තිබුණි. එකී උපදේශන කමිටුව විසින් 2018 දෙසැම්බර් 13 දිනැතිව සිය වාර්තාව අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි. (ඇමුණුම - 50) එහි පහත තොරතුරු අන්තර්ගත විය.

I. මූල්‍ය ශක්‍යතාවය, ස්ථාවරත්වය හා කළමනාකරණයේ පවතින දුර්වලතාවයන්
II. යෝජිත ස්වභාවයේ හා පරිමාණයේ අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවන ඌන පළපුරුද්දක් හා අත්දැකීම්වලින් යුක්ත කළමනාකරණ මණ්ඩලයක් පැවතීම.
III. අවධානම් කළමනාකරණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබීම.
IV. මෙවැනි ආයතනයක ස්වභාවය පොදු සීමිත සමාගමක් ලෙස සංස්ථාපිත කිරීමට යෝජනා කර තිබිම.

7.6 රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචිය සඳහා හිරා පදනම විසින් ඉල්ලීම් කර තිබීම සම්බන්ධ නිරීක්ෂණ

---

පසුබිම් තොරතුරු

---

7.6.1 හිරා පදනම විසින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි වීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත 2011 ජූලි 06 දින අයදුම් පත්‍රයක් (ඇමුණුම - 51) ඉදිරිපත් කර තිබුණි.

7.6.2 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් 2011අගෝස්තු19 දිනැති ලිපි මඟින් (ඇමුණුම - 52 හා 53) විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හා රාජ්‍ය බුද්ධි ප්‍රධානීගෙන් උක්ත ආයතනය සම්බන්ධයෙන් නිෂ්කාශන ඉල්ලා තිබුණි.

7.6.3 විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි අධ්‍යක්ෂ ජනරාල් (බහු පාර්ශවීය සම්බන්ධතා) විසින් 2011 සැප්තැම්බර් 02 දිනැති ලිපියක් (ඇමුණුම - 54) මඟින් උක්ත ආයතනය විදේශීය ආයතන හා ඒජන්තවරු සමඟ සම්බන්ධතාවයක් ඇති බවට තොරතුරු නොමැති බැවින් හිරා පදනම සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි නිරීක්ෂණයක් නොවන බව දන්වා තිබුණි.

7.6.4 ලැබී ඇති තොරතුරු අනුව හිරා පදනමෙහි සභාපති හැර සෙසු සාමාජිකයන් සම්බන්ධයෙන් අහිතකර දැනුම්දීම් පවතින හෙයින් ජාතික බුද්ධි කාර්යාංශය වෙත උක්ත ආයතනය නිර්දේශ කළ නොහැකි බව 2011 ඔක්තෝබර් 18 දිනැති ලිපියක් (ඇමුණුම - 55) මඟින් ජාතික බුද්ධි ඒකකය විසින් දන්වා යවා තිබුණි.

7.6.5 රාජ්‍ය බුද්ධි කාර්යාංශය නිර්දේශ නොකරන බැවින් හිරා පදනම රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කළ නොහැකි බව 2012 අප්‍රේල් 18 දින රාජ්‍ය නොවන සංවිධාන ජාතික ලේකම් කාර්යාලය විසින් හිස්බුල්ලා මහතා වෙත දන්වා යවා තිබුණි. (ඇමුණුම - 56)

7.7 මඩකලපුව විශ්වවිද්‍යාල විද්‍යායතනය පවත්වාගෙන යාම සඳහා කාන්තන්කුඩි නගර සභාව වෙතින් ගොඩනැගිල්ලක් බද්දට ගැනීම.

-----------------------------------------------------------------------------------------------------------

පසුබිම් තොරතුරු

--------------------

7.7.1 කාත්තන්කුඩි නගර සභාවේ සභාපතිවරයා විසින් 2014 මැයි 10 දිනැති බදු ගිවිසුමක් මගින් මඩකලපුව නගර සභාවේ පුස්තකාල ගොඩනැගිල්ල හා පරිපාලන ගොඩනැගිල්ලෙන් කොටසක් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත වර්ෂ 8 ක කාලයක් සඳහා රු.5,000 ක මාසික කුලියකට දී තිබුණි. (ඇමුණුම - **57**)

7.7.2 මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයේ පරිපාලන නිලධාරී විසින් 2014 නොවැම්බර් 18 දිනැති ලිපියක් මගින් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය දැනටමත් නගර සභා ගොඩනැගිල්ල තුල ක්‍රියාත්මක වන බවත් එම ගොඩනැගිලි වර්ෂ 08 ක කාලයක් සඳහා බද්දට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස සභාපති, කාත්තන්කුඩි නගර සභාව වෙත ඉල්ලීමක් කර තිබුණි. (ඇමුණුම 58 හා 95)

7.7.3 බදු පදනම මත ලබා දී තිබූ එක් ගොඩනැගිල්ලක් දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ නගර සභා පුස්තකාලය පවත්වාගෙන යාමේ අරමුණින් රු.මිලියන 40 ක වියදමින් ඉදිකර තිබූ අතර උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 60 ක වියදමින් ඉදිකර තිබූ අනෙක් බදු දී තිබූ ගොඩනැගිල්ල නගර සභා පරිපාලන කටයුතු සඳහා යොදා ගැනීමට යෝජිතව තිබුණි.

7.7.4 කාත්තන්කුඩි නගර සභාවේ ලේකම්වරයා විසින් 2017 අප්‍රේල් 18 දිනැති උක්ත බදු ගොඩනැගිලි සඳහා වන රජයේ තක්සේරු බදු වටිනාකම ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපියට ප්‍රතිචාරීව 2017 ජුනි 06 වැනි දින නැගෙනහිර පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් බදු කුලී සම්බන්ධ තක්සේරු වාර්තාවක් ලබා දී තිබුණි. (ඇමුණුම - **59**)

7.7.5 උක්ත තක්සේරු වාර්තාවට අනුව භාවිතා කළ ගොඩනැගිලි වෙනුවෙන් රජයේ තක්සේරු බදු කුලිය මාසික රු.197,500 වන බවත් නගර සභාව වෙත ගෙවා ඇති බදු කුලිය රු.5,000 ක් පමණක් බවත් ඒ අනුව ගිවිසුම් ගත දිනයේ සිට 2017 ජුනි 30 දක්වා අයවිය යුතු හිඟ බදු කුලිය රු.8,475,000 ක් වන බැවින් එම හිඟ බදු කුලිය ඉක්මණින් ගෙවන ලෙසත් දන්වා තිබුණි. . (ඇමුණුම - **60**)

7.7.6 මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතය විසින් 2018 මාර්තු18 දිනැති ලිපියක් මගින් එදින සිට බද්දට ගත් නගර සභා ගොඩනැගිල්ල නැවත භාරදෙන බව නගර සභාව වෙත දන්වා යවා තිබුණි. . (ඇමුණුම - 61)

7.8 බදු ඉඩමේ ගොඩනැගිලි ඉදිකිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් වාකරේ ප්‍රාදේශීය සභාවේ කාර්ය භාරය.

-------------------------------------------------------------------------------------------------------------

පසුබිම් තොරතුරු

----------------------

7.8.1 මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම විසින් උක්ත බදු ඉඩමේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් අනුමැතීන් සඳහා වාකරේ ප්‍රාදේශීය සභාව වෙත පහත පරිදි ගෙවීම් සිදුකර තිබුණි. (ඇමුණුම - 62)

වගු අංක 03 - බදු ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් වෙනුවෙන් අනුමැතිය සඳහා ගෙවීම් කිරීම.

| අනු අංකය | කුවිතාන්සි අංකය | දිනය | ගෙවූ මුදල රු. | ගෙවීම් කිරීමට හේතුව |
|---|---|---|---|---|
| 1 | 2547 | 2014/08/26 | 500.00 | අයදුම්පත්‍ර ගාස්තුව. |
| 2 | 2548 | 2014/08/26 | 500.00 | අයදුම්පත්‍ර ගාස්තුව. |
| 3 | 2962 | 2014/12/10 | 8,262.50 | විමර්ෂණ ගාස්තුව. |
| 4 | 3630 | 2016/11/07 | 15,000.00 | ගොඩනැගිලි සැලසුම් නිවැරදි කිරීමේ ගාස්තුව. |
| 5 | 3677 | 2016/11/21 | 5,000.00 | ගොඩනැගිලි සැලසුම් නිවැරදි කිරීමේ ගාස්තුව. |
| | එකතුව | | 29,262.50 | |

7.8.2 ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය වංචා විමර්ශන ඒකකය හා ජාතික විගණන කාර්යාලය විසින් පිළිවෙලින් 2019 අගෝස්තු 28 හා 2019 මැයි 22යන දිනයන්හීදී මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම විසින් උක්ත බදු ඉඩම තුල සිදුකෙරෙන ඉදිකිරීම් සම්බන්ධයෙන් වාකරේ ප්‍රාදේශීය සභාවේ අනුමැතීන් හා අදාළ ලිපිගොනු ලබා දෙන ලෙස සභා ලේකම්වරයාගෙන් ඉල්ලීම් කර තිබුණි. (ඇමුණුම - 63 හා 64)

7.8.3 එම ඉල්ලීම්වලට අදාළ තොරතුරු ලබා දීම සඳහා සභාව සතුව ලිපි ගොනුවක් පවත්වාගෙන ගොස් නොමැති බවත් දැනට උක්ත විෂය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් වෙත ලිපි ගොනු භාරදීමේදී එවැනි ලිපි ගොනුවක් භාර දී නොමැති බවත්, ඉදිකිරීම් සිදුවන කාල සීමාවේදී උක්ත විෂයන්හි රාජකාරී කළ නිලධාරීන් ස්ථාන මාරු ලබා ඇති බවත් ඔවුන්ගෙන් ඒ සම්බන්ධ විමසීම් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දැනුම් දෙමින් 2019 මැයි 10 දින පළාත් පාලන කොමසාරිස් වෙත හා 2019 මැයි 14 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත වාකරේ ප්‍රාදේශීය සභා ලේකම්වරයා විසින් දන්වා යවා තිබුණි. (ඇමුණුම -65 හා 66)

8. විගණන නිරීක්ෂණ

-------------------

8.1 වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් බැටික්ලෝ යුනිවර්සිටි කොලේජ් (පුද්ගලික) සමාගම වෙත වෘත්තීය අධ්‍යාපනයට අනුමැතිය ලබාගැනීම.

------------------------------------------------------------------------------------------------------

8.1.1 උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචිය සඳහා හිරා පදනම විසින් කර තිබූ ඉල්ලීම් ලිපියට ප්‍රතිචාරීව ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හිරා පදනම වෙත 2013 මාර්තු 21 දින දන්වා ඇතත්, සම්පූර්ණ කර නොමැති එම අවශ්‍යතාවයන් කවරේද යන්න සඳහන් කර නොතිබුණි.

8.1.2 **ඉහත 7.1.2 ඡේදය ප්‍රකාරව එම්.එල්.එම්.ඒ.හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිවරයා තමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය හා නියෝජ්‍ය අමාත්‍ය ධූරය යොදාගනිමින් කරමින් හිරා පදනම නම් පෞද්ගලික ආයතනයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් කටයුතු කර තිබුණි.**

8.1.3 වෘත්තීය අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට හිරා පදනම විසින් කර ඇති ඉල්ලීම ඉටු කිරීමට අවශ්‍ය කරන මූලික අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබිම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර තිබියදී එම ආයතනය වෙත බැටික්ලෝ විශ්ව විද්‍යාල විද්‍යායතනය නමින් වූ උසස් අධ්‍යාපන ආයතනයක් ආරම්භ කිරීම සඳහා තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් අවසර ලබාදෙමින්, 2013 අගෝස්තු 15 දින සිට බලාත්මක වන පරිදි වර්ෂ 03 ක් සඳහා හිරා පදනම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි.

8.1.4 එලෙස අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට පෙර උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ශක්‍යතාවයන් සම්පූර්ණ කර තිබේද යන්න පරීක්ෂා කර බැලිය යුතු වුවත්, එවැනි කිසිදු පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. කෙසේ නමුත් ගිවිසුම්ගත වී දින 05 කට පසු අමාත්‍යාංශ ලේකම්වරයා උක්ත කරුණ පරීක්ෂා කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණි.

8.1.5 ත්‍රිපුද්ගල කමිටුව විසින් 2013 ජූනි 24 දිනැතිව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ වාර්තාවට අනුව යෝජිත මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය තුළ උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය මූලික සුදුසුකම් වන මූල්‍ය ස්ථාවරත්වය, පවතින ගොඩනැගිලි හා ඒවායේ ප්‍රමාණවත්භාවය සම්බන්ධයෙන් ගැටළුකාරි බව පෙන්වා දී ඇතත්, පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය ගුණාත්මක සාධකයන් වන පිළිගත් දේශකවරුන් , පාඨමාලා අන්තර්ගතයන් හා පාඨමාලා සඳහා අවශ්‍ය වෙනත් භෞතික අවශ්‍යතා සම්බන්ධයෙන් කරුණු දක්වා නොතිබුණි.

කෙසේ නමුත් එම වාර්තාවට අනුව වෘත්තිය අධ්‍යාපන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත අවශ්‍ය මූලික සුදුසුකම් පැවති බව විගණනයේදී සනාථ නොවුණි.

8.1.6 ගිවිසුම්ගත පළමු පාර්ශ්වය වන වෘත්තීය පුහුණු හා නිපුණතා අමාත්‍යාංශය විසින් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයේ පාලක සභාව වෙත නියෝජිතයන් දෙදෙනෙකු පත් කිරීම හැර අවබෝධතා ගිවිසුමෙහි පළමු පාර්ශ්වය විසින් ඉටු කළ යුතුව තිබූ ඉහත 6.1.4. ඡේදයේ සඳහන් කිසිදු වගකීමක් ඉටු කර නොතිබුණි. පාලක සභාව වෙත පත්කළ නියෝජිතයන් දෙදෙනා පාලක සභා රැස්වීම්වලට සහභාගි වුයේද, පාලක සභා රැස්වීම් සඳහා කැඳවීම් ලැබුණේද හා පාලක සභා රැස්වීම්වලදී ගනු ලැබූ තීරණයන් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් වෘත්තීය පුහුණු හා නිපුණතා අමාත්‍යාංශය සතු නොවීම තුළ පාලක සභා රැස්වීම් සඳහා එම නියෝජිතයින් දෙදෙනා සහභාගි වී තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

8.1.7 ගිවිසුමෙහි පළමු පාර්ශ්වයේ වගකීම් අතර හා පොදු වගකීම් අතර ගිවිසුමට අත්සන් කර ඇති තෙවන පාර්ශ්වය වන වෘත්තීය හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ වගකීම් දක්වා ඇති නමුත් ගිවිසුමට අත්සන් කිරීමෙන් පසු කිසිදු අවස්ථාවක මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙහි කාර්යයන් සම්බන්ධයෙන් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය දායකත්වයක් දැක්වූ බවට හෝ උක්ත වගකීම් ඉටු කර ඇති බවට තහවුරු කරගත නොහැකි විය.

8.1.8 NVQ පාඨමාලා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර තිබියදීත් එවැනි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා විශ්ව විද්‍යාල විද්‍යායතන සභාපතිවරයා සිදුකර තිබූ ඉල්ලීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2013 අගෝස්තු 05 දිනැති ලිපියක් මගින් ලබාදී ඇති අනුමැතිය අවිධිමත් බව විගණනයේදී නිරීක්ෂණය විය.

8.1.9 උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම සඳහා අදාළ වන සුදුසුකම් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය සම්පූර්ණ කර නොමැති බව තහවුරු කර තිබූ ත්‍රිපුද්ගල කමිටුවේ සභාපතිවරයාම නැවත පරීක්ෂාවකින් තොරව කොමිෂන් සභාවේ 205 වන කවුන්සිලය වෙත එහි ලියාපදිංචිය සඳහා පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබුණි. (ඇමුණුම -67)

8.1.10 උක්ත කොමිෂන් සභා පත්‍රිකාව සඳහා 2015 ජූලි 09 දින අනුමැතිය ලැබී ඇතත්(ඇමුණුම - 68), ඊට පෙර දිනයක් වූ 2015 මාර්තු 02 දින කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ දිනය ලෙස සලකා

පරිගණක පද්ධතියට ද ඇතුළත් කර එදින සිට කොමිෂන් සභාවේ අනුමත පාඨමාලා පවත්වාගෙන යාම සඳහා විද්‍යායතනය වෙත අවස්ථාව ලබාදී තිබුණි.

8.1.11 විශ්ව විද්‍යාල විද්‍යායතනය තුළ පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍යයන් 49 දෙනෙකු වෙත (ඇමුණුම - 69) 2016 වර්ෂයේදී වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සහතික පත්‍ර නිකුත් කර තිබු නමුත් එම පාඨමාලාවලට අදාළ විෂය නිර්දේශ ආවරණයන්, පාඨමාලා ඇගයීම, සහතිකපත්‍ර ලබාදීම සඳහා අවශ්‍ය නිර්දේශ සහ අනුමැතීන් ආදියට අදාළ කිසිදු ලිඛිත සාක්ෂියක් ගොනුගත කර නොතිබුණි.

8.1.12 තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මගින් හිරා පදනමේ සහයෝගීත්වය මත මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය පිහිටුවන ලද බව හඳුන්වා දෙමින් විද්‍යායතනය කළමනාකරණය මගින් රාජ්‍ය ලාංඡනයද උපයෝගී කර ගනිමින් පාඨමාලා සඳහා අයදුම් කිරීමට ආරාධනා කරමින් පළ කර තිබු පුවත්පත් දැන්වීම තුළ රාජ්‍ය ආයතනයක් ලෙස ව්‍යාජ ලෙස ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය කටයුතු කර තිබුණි. (ඇමුණුම - 70)

8.1.13 රාජ්‍ය විශ්ව විද්‍යාලයක් වන නැගෙනහිර විශ්ව විද්‍යාලය 1981 සිට 1988 දක්වා මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය ලෙස ක්‍රියාත්මක වු බැවින්, මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය නමින් වෙනත් ආයතනයක් ක්‍රියාත්මක වීම තුළ නැගෙනහිර විශ්ව විද්‍යාලය සමඟ සම්බන්ධතාවයක් පිළිබඳ නිතිමය ඇඟවීම් ඇතිවිය හැකි බව 2014 ජූනි 05 දිනැති ලිපියක් මගින් නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා විසින් වෘත්තිය පුහුණු අමාත්‍යවරයා දැනුවත් කර ඇතත්, ඒ සඳහා කිසිදු අවධානයක් යොමු නොකර වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එකී විශ්ව විදයාල විද්‍යායතනයට උක්ත නමින් පෙනී සිටිමින් NVQ සහතික ලබාදීමට අවස්ථාව ලබාදී තිබුණි.

8.1.14 මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට පෙර වෘත්තීය පුහුණු අමාත්‍යාංශය කිසිදු පෞද්ගලික සමාගමක් සමඟ එවැනි අවබෝධතා ගිවිසුම්වලට එළඹ නොතිබුණි. කෙසේ නමුත් අර්ධ රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ජයවර්ධනපුර රෝහල සමඟ 2013 මැයි 09 දින එක් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එකී අවබෝධතා ගිවිසුමට තරුණ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම්වරයා අත්සන් කර ඇතත්, උක්ත මඩකලපුව කැම්පස් පෞද්ගලික සමාගම සමඟ වු අවබෝධතා ගිවිසුමෙහි තරුණ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් එම අමාත්‍යවරයා අත්සන් කර තිබුණි.

8.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම වෙත ඉඩම් නිදහස් කිරීම.

---

8.2.1 අංක ඩී.එල්/1/1 හා 2013 මැයි 18 දිනැති මහවැලි අධිකාරිය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛය ප්‍රකාරව (ඇමුණුම **-71**) මහවැලි ඉඩමක් බැහැර කිරීමට පෙර කලාපීය භෞතික සැලසුම් කමිටුවෙහි හා අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ) වෙතින් නිර්දේශ ලබාගත යුතු වුවත්, මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත අක්කර 35 ක ඉඩම බැහැර කිරීමට පෙර ඇගයීම් ක්‍රියාවලිය තුළ උක්ත නිර්දේශයන් ලබාගෙන නොතිබුණි. කෙසේ නමුත්, 2017 නොවැම්බර් 02 දින අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) විසින් උක්ත ඉඩම බදුකරු වෙත ලබාදීමේ බදු ඔප්පුව නිකුත් කිරීමේ ඉදිරි කටයුතු සඳහා නිර්දේශ ලබාදෙන ලෙස ඉල්ලීමට (ඇමුණුම - 72) ප්‍රතිචාරීව අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) විසින් නිර්දේශ කර තිබුණි. (ඇමුණුම - 73)

8.2.2 1947 අංක 08 දරන ඉඩම් ආඥා පනතේ 199 (**3**) වගන්තිය ප්‍රකාරව(ඇමුණුම - **74**) දීර්ඝකාලීන බද්දක් පසුව ලබාදීමේ අරමුණින් කිසිදු අවස්ථාවක වාර්ෂික බද්දක් මත රජයේ ඉඩම් බැහැර නොකළ යුතු බව අවධාරණය කර ඇති අතරම, බදු දීමනාකරුගේ පූර්ව අවසරයකින් තොරව වාර්ෂික බලපත්‍රයක් මත බද්දට ගත් ඉඩමක් තුළ ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම් නොකළ යුතු බව ඇල්.සී. 75 දරන වාර්ෂික අවසරපත්‍ර පෝරමයෙ හි සඳහන් වේ. (ඇමුණුම - **15**) එහෙත් වාර්ෂික අවසර බලපත්‍ර තුළ **"**ගොඩනැගිලි ඉදිකිරීමේ අවසරය ඇත.**"** යන්න සඳහන් කරමින් වාර්ෂික බලපත්‍ර සහිත ඉඩම තුළ දිර්ඝකාලීන විශාල ව්‍යාපෘතියක් සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීමට මහවැලි අධිකාරිය විසින් අවසර ලබා දී පසුව වාර්ෂික බද්ද දීර්ඝකාලීන බද්දකට පරිවර්තනය කිරිමට කටයුතු කිරීම තුළ අනුදැනුම සහිතව ඉඩම් පනතේ උක්ත වගන්තිය උල්ලංඝණය කර තිබුණි.

8.2.3 ඉඩම් පනතේ 199(4) ප්‍රකාරව(ඇමුණුම **-74**) අමාත්‍යවරයා විසින් විශේෂයෙන් උපදෙස් දී නොමැති අවස්ථාවන්හිදී ඉඩම් පනත බලාත්මක කිරීම පිණිස පනවන ලද රෙගුලාසි අංක 21(2) ප්‍රකාරව(ඇමුණුම - **75**) **"**යෝජිත බදුදීම සම්බන්ධයෙන් මහජන විරෝධතා වේ නම් ඉදිරිපත් කිරීම පිණිස**"** ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවත්, එකී වගන්තිය ගැසට් පත්‍රයේ පළ නොකර ඉඩම් පැවරීම සඳහා අමාත්‍යවරයා වෙත පනත තුළ වූ වියතිරේකී බලය ප්‍රයෝජනයට ගනිමින් එය ගැසට් නොකිරීමට තීරණය කිරීමට පාදක වූ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ගැසට් නිවේදනය නිකුත් නොකිරීම සුදුසු බව අධිකාරිය මගින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කර තිබුණි. (ඇමුණුම - **20**)

8.2.4 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2013 ජූලි 04 දිනැතිව නිකුත් කර ඇති 270016 දරන කැඩැස්තර සිතියමට අනුව (ඇමුණුම - **76**) උක්ත බදු ඉඩම තුළ ලොට් අංක 800, 804 හා ලොට් 808 යන ඉඩම් කැබලි තුන කුඹුරු ඉඩම් ලෙස හඳුනාගෙන තිබූ අතර, සිතියමෙහි බදු දී ඇති ඉඩම් කැබලි අතරින් අංක 802 නමින් නම් කරන ලද ඇල මාර්ගයක් දක්වා තිබුණි. අනවසර වගාකරුවන් විසින් වී වගාව සඳහා මෙම ඉඩම භාවිතා කර තිබීයදී හා සිතියමෙහි ඇල මාර්ගය තුළින් කුඹුරු සඳහා පහසුවෙන් ජලය ලබාගැනීමට හැකියාව තිබියදී ඩී.එල්. 1/1 හා 2013 මැයි 18 දිනැති මහවැලි අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව භෞතික සැලසුම් කමිටුවේ හා අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා සැලසුම්) ගේ නිර්දේශයන් ලබාගැනීමකින් තොරව කුඹුරු ඉඩමක් වාණිජ කටයුත්තක් වෙනුවෙන් හිරා පදනම වෙත ලබාදීම සඳහා සැලසුම් සහගත ලෙස කැඩැස්තර සිතියමෙහි "කුඹුරු ඉඩම" වෙනුවට "වෙනත්" ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් වෙනස් කරවා ගැනීමට අසේලපුර මහවැලි කොට්ඨාශ කළමනාකරු හා වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරු කටයුතු කර තිබුණි.

8.2.5 උක්ත නිරීක්ෂණ අංක 04 අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන ලද හා ස්ථිර වාරි ක්‍රමයක් ස්ථාපනය කර ගැනීමේ හැකියාව සහිත ඉඩම් කැබලි වාණිජ කටයුත්තක් වෙනුවෙන් බදුදීමට පෙර ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස්වරයා වෙතින් නිෂ්කාශන ලබාගත යුතු වුවත්, මහවැලි අධිකාරිය විසින් එවැනි කිසිදු විමසීමකින් තොරව වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ සිට උක්ත ඉඩම බද්දට දී තිබුණි.

8.2.6 බදු පදනම මත මහවැලි අධිකාරිය වෙතින් ලබාගත් ඉඩම තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පස් පිරවීමක් සිදුකර ඇති අතර, අදාළ පිරවීම් සඳහා පහත අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(I) පස් පිරවීම සඳහා අසල වූ රක්ෂිතය තුළින් පස් කපා තිබූ නමුත් 2009 අංක 66 දරන පනත මගින් සංශෝධිත 1992 අංක 33 දරන පනතේ විධිවිධාන ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තුළින් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. (ඇමුණුම - **77**)

(II) රක්ෂිත ප්‍රදේශයක් තුළ පස් කැපීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලබාගෙන නොතිබුණි.

(III) පස් ප්‍රවාහනය සඳහා වාකරේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(IV) කුඹුරු ඉඩම් හා පහත් බිම් ගොඩ කිරීම සම්බන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ලිඛිත අවසරය ලබාගෙන නොතිබුණි.

8.2.7 ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් 2013 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත් අදාළ ව්‍යාපෘතිය හා ඉදිකිරීම් සැලැස්ම කෝරලේපත්තු උතුර - වාකරේ ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම විධිමත් ආකාරයට සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ නමුත් මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම විසින් කොරලේපත්තු උතුර - වාකරේ ප්‍රාදේශිය සභාවේ ලේකම් හා තාක්ෂණ නිලධාරි විසින් අත්සන් කරන ලද ගොඩනැගිලි සැලසුමක පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කළ අතර, පහත කරුණු හේතුවෙන් ඉහත අත්සන් සමඟ වූ ගොඩනැගිලි සැලසුම විධිමත් අනුමැතියක් බව තහවුරු නොවිය. (ඇමුණුම - **78**)

(I) උක්ත අත්සන් යෙදීම සඳහා පදනම්වූ ලිපි හා පරීක්ෂණ වාර්තා සහිත ලිපිගොනුවක් ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබීම.

(II) උක්ත විෂය විමර්ශනය සඳහා කමිටුවක් හා විෂය ප්‍රවීණයන්ගෙන් යුත් පරික්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබීම.

(III) අනුමැතිය ලබාදීමට පෙර පරිසර බලපෑම් ඇගයීමේ වාර්තවක් කැඳවා නොතිබිම.

(IV) ස්ථානීය පරීක්ෂණ වාර්තා, විජී රේඛා, සහතික ඉදිකිරිම් සඳහා වූ උප සැලසුම්, මෙන්ම වෙනත් අදාළ අධිකාරීන් වෙතින් නිෂ්කාශනයන් ලබාගෙන නොතිබිම.

8.2.8 බදුකරු වෙත බදුදී තිබූ ඉඩමට අදාළ පිඹුරේ මායිමට පිටතින් වූ බදුකරුට නීත්‍යානුකූල හිමිකමක් නොමැති රජයේ ඉඩම් තුළද, අංක බී 12 – 19 දක්වා වූ ගොඩනැගිලි හා බී. 24 සිට බී34 දක්වා වූ ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම් කර ප්‍රධාන ගොඩනැගිලි සැලසුම සකස් කර තිබුණි. නමුත් ඉඩමේ පිඹුර පිළිබඳ සැලකිලිමත්වීමකින් තොරව ගොඩනැගිලි සැලසුම පිළියෙල කර තිබීම හා නීත්‍යානුකූල හිමිකම් රහිත ඉඩම් තුළ පවා ගොඩනැගිලි ඉදිකළ හැකි වන පරිදි එම සැලසුම් පිළියෙල කර තිබීයදී ඒ බව නොතකා වාකරේ ප්‍රදේශිය සභා ලේකම් හා තාක්ෂණික නිලධාරියා විසින් එම ගොඩනැගිලි සැලසුම තුළ සිය අත්සන යොදා අනුමත කර තිබුණි. උක්ත අවිධිමත් අනුමැතිය සහිත ගොඩනැගිලි සැලැස්ම මහවැලි අධිකාරියෙහි කොට්ඨාශ කළමනාකරු විසින් සිය අත්සන යොදා සහතික කර තිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘතිය තුළ වූ සැබෑ ඉදිකිරීම් උක්ත සැලසුම තුළ වූ ඉදිකිරීම්වලට අනනුකූල බැව් නිරීක්ෂණය විය. (ඇමුණුම - **79**)

8.2.9 බදුකරුට භුක්ති විඳිය හැකි ඉඩම් ප්‍රමාණය බදු ගිවිසුමේ හා පිඹුරෙහි දක්වා ඇති ඉඩම් ප්‍රමාණයට සීමා විය යුතු නමුත් බදුකරු විසින් කිසිදු නීත්‍යානුකූල හිමිකමකින් තොරව බදු දේපලට අමතරව බදු දේපලෙහි සීමා මායිම්වලට ඔබ්බෙන් වූ තවත් අක්කර 09 කට වැඩි ඉඩම් ප්‍රමාණයක ස්ථිර ගොඩනැගිලි ඉදිකර අනීතිකව භුක්ති විඳිනු ලබන බව නිරීක්ෂණය විය. තවද, බදු ඉඩම් අතර වූ ඇල මාර්ගය සහ අධි බලැති විදුලි රැහැන් මාර්ගය වෙනුවෙන් අධිකාරිය විසින් වෙන්කර ඇති රක්ෂිත ප්‍රදේශ තුළ මහවැලි අධිකාරියේ කිසිදු අනුමැතියකින් තොරව ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කර ඇතත්, මහවැලි අධිකාරිය විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

8.2.10 වාණිජ පරමාර්ථයෙන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ/හා දීර්ඝ කාලීන බදු පදනමින් ව්‍යාපෘතියක් සඳහා මහවැලි ඉඩම් බදු දීමට පෙර යෝජිත ව්‍යාපෘති සැලසුම් වලට අනුකූලව සිදුවන පරිසර බලපෑම් සම්බන්ධයෙන් පරිසර අධිකාරිය වෙතින් පරිසර වාර්තාවක් කැඳවීමට කටයුතු කළ යුතු වුවත් ඉඩම් බදු දීම සම්බන්ධයෙන් පරිසර වාර්තාව කැඳවා නොතිබුණි.

8.2.11 බදු කරු වෙත උක්ත මහවැලි ඉඩම බදු දීම සම්බන්දයෙන් වූ දීර්ඝකාලින බදු ඔප්පුවේ කොන්දේසි අංක 8 හා වාර්ෂික බලපත්‍රයෙහි කොන්දේසි අංක 9 ප්‍රකාරව ඉඩමේ මායිම් පෙන්වන ඉඩම් ඉම් සලකුණු වෙනස් නොකර පවත්වාගෙන යායුතු වුවත් බදු ඉඩම තුල මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සලකුණු කරන ලද සීමා මායිම් හඳුනා ගත හැකි පරිදි නඩත්තු කර නොතිබුණි. මායිම් පෙන්වන මායිම් ඉම් හඳුනාගත නොහැකි අවස්ථාවන් හිදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් බදුකරුගේ වියදමින් නැවත මිනුම් කර මායිම් ඉම් ස්ථාපනය කිරීමට උපදෙස් ලබා දිය යුතු වුවත් නේවාසික ව්‍යාපාර කළමණාකරු ( මහවැලි බී කළාපය ) විසින් 2019 අගෝස්තු 10 දිනැති ලිපියක් මගින් බදුකරුගේ දායකත්වයකින් තොරව නැවත මැනීම සඳහා මඩකලපුව මිනින්දෝරු අධිකාරී කාර්යාලයෙන් ඉල්ලීමක් කර තිබුණි.

8.2.12 මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම වෙත මහවැලි ඉඩම දිර්ඝකාලීන බදුකරයක් මත පැවරීම සඳහා 2018 පෙබරවාරි 01 දින බදු ඔප්පුව අත්සන් කර තිබූ අතර, ගිවිසුම ක්‍රියාත්මක වන දිනය 2013 ජූලි 12 දින දක්වා පසුදාතම් කර තිබුණි. මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම පුද්ගල ඒකකයක් ලෙස සමාගම් පනත යටතේ සංස්ථාගත වී ඇති දිනය 2015 ජූලි 14 දින වීම හේතුවෙන් ගිවිසුම බලාත්මක වන දිනට ගිවිසුම්ගත වූ නමින් සමාගමක් බිහි වී නොතිබුණි. මේ හේතුවෙන් මෙකී බදු ගිවිසුමට එළඹී දිනයේදිම ගිවිසුම නීතිය තුළ ක්‍රියාත්මක කළ නොහැකි (හිස් ගිවිසුමක්) බව නිරීක්ෂණය විය.

8.3 මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ගිවිසුම්ගත වීම.

---

8.3.1 ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස උක්ත ව්‍යාපෘතිය ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ මුල් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය සැලසුමෙහි ඇමරිකන් ඩොලර් මිලියන 40.2 ක විදේශීය ආයෝජනයක් කරන බව දක්වා ඇතත්, දෙවන ඉල්ලුම්පත්‍රයේ එය ඇ.ඩො.මිලියන 3.2 ක් ලෙස සඳහන් කර තිබුණි. පළමු අයදුම්පත්‍රය තුළ වූ ඉහළ වටිනාකමකින් යුත් විදේශිය ආයෝජන දෙවන අයදුම්පත්‍රය තුළ ඇතුළත් නොවීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරිමකින් තොරව ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

ඡේදය සඳහා ආයෝජන මණ්ඩලය විසින් ලබාදි ඇති පිළිතුර

පළමු අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද ඇමරිකන් ඩොලර් මිලියන 40.2 සම්පූර්ණයෙන්ම විදේශ ආයෝජනයක් ලෙස ඉදිරිපත් කර ඇතත්, විදේශ ආයෝජකයා ගැන සඳහන් කර නැත. තවද අපගේ ආයෝජන අයදුම්පතෙහි අංක 5 යටතේ විදේශ ආයෝජන සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නොවේ. එමෙන්ම ඇමරිකන් ඩොලර් මිලියන 40.2 වැනි විශාල ආයෝජනයක් ලබාදෙන ආයෝජකයා සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් නොමැති බැවින් එය නොසලකා අනුමැතිය දීමට තීරණය කර ඇත. ගිවිසුම අත්සන් කිරීම හරහා එම තිරණය ආයෝජකයා විසින් පිළිගෙන ඇත. (ඇමුණුම-80)

8.3.2 උක්ත ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට යෝජිත භූමිය ව්‍යාපෘතියෙහි නමින් දීර්ඝකාලීනව බදු පදනමින් (අවම වශයෙන් වසර 30 ක කාලයක් සඳහා) ලබාගත යුතු බවට ආයෝජන මණ්ඩල සහකාර අධ්‍යක්ෂ ආයෝජන ඇගයීම් විසින් විධායක අධ්‍යක්ෂ ආයෝජන ඇගයිම් ප්‍රවර්ධන වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇතත්, එම නිර්දේශ නොසලකා භූමියේ අයිතිය සම්බන්ධ කිසිදු නිෂ්කාශනයකින් තොරව 2016 ජනවාරි 12 දින ව්‍යාපෘතිය සඳහා ආයෝජන මණ්ඩල අනුමැතිය ලබාදී පසුව 2016 මැයි 19 දි ආයෝජන මණ්ඩලය හා බැටික්ලෝ කැම්පස් ලිමිටඩ් ආයතනය ගිවිසුමකට එළඹ තිබුණි.

8.3.3 ව්‍යාපෘතිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි විෂය පථයට අයත් නොවන බව ආයෝජන මණ්ඩලය වෙත දන්වා තිබියදී හා උක්ත ව්‍යාපෘතිය වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව තුළ ලියාපදිංචි වී නොමැති තත්ත්වයක් තුළ ව්‍යාපෘතියේ අරමුණු හා පරමාර්ථ සහ එකි අරමුණු හා පරමාර්ථ කරා ළඟා වන ආකාරය පැහැදිලි කර ගැනිමකින් තොරව ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදි තිබුණි. (ව්‍යාපෘතියේ නමින් දීර්ඝකාලීන බදු පදනමින් මහවැලි ඉඩම බදු පදනමින් ලබාගෙන ඇත්තේ 2018 පෙබරවාරි 01 දිනදිය.)

8.3.4 ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ලියාපදිංචි වීමට අදහස් කරනු ලබන ආයතනයක් විසින් සිය අයදුම්පත්‍රය සමඟ යෝජිත ව්‍යාපෘති භූමියෙහි නිත්‍යානුකූල හිමිකම සහිත ඉඩමේ මිනින්දෝරු සැලැස්ම, ප්‍රාදේශිය සභා අනුමැතිය සහිත යෝජිත ගොඩනැගිලි සැලැස්ම, විජී රේඛා සහතිකය හා ඉඩම් හිමියාගේ එකඟතාවය සහිත ලිපිය ඉදිරිපත් කළ යුතු වුවත්, උක්ත ව්‍යාපෘතිය සඳහා වු අයදුම්පත්‍රය සමඟ එම ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතියේ ශක්‍යතාවය ඇගයීම සඳහා අත්‍යවශ්‍ය වන ඉහත කී ලේඛනයන් රහිතව ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය ඇගයීම් කර අනුමැතිය ලබාදී තිබුණි.

8.3.5 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2016 මාර්තු 03 හා 2016 මාර්තු 30 දිනැති ලිපි මගින් යෝජිත ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාගැනීමට කරන ලද ඉල්ලීම් ලිපිවලට ප්‍රතිචාරීව ඉඩම් සංවර්ධන කටයුතු දැනටමත් අවසන් වි ඇති හෙයින් හා ව්‍යාපෘතියේ ඉදිකිරීම්වලින් හරි අඩකට වඩා අවසන් හෙයින් පාරිසරික බලපෑම් ඇගයීම අර්ථශූන්‍ය ක්‍රියාවක් බව පරිසර අධිකාරිය විසින් 2016 ජූලි 08 දින ආයෝජන මණ්ඩලය වෙත දන්වා තිබුණි.(ඇමුණුම - 81) කෙසේ නමුත් පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව හා පරිසර අධිකාරියෙන් පිළිතුරක් ලැබීමට පෙර ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් පිළිබඳ කිසිදු තැකීමකින් තොරව ආයෝජන මණ්ඩලය විසින් උක්ත ව්‍යාපාතිය සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

8.3.6 ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නව ව්‍යාපෘතියක් විය යුතු බවට හා පැවති ව්‍යාපාර ආයතනයක ප්‍රති ස්ථාපනයක් හෝ එවැනි පවත්නා ආයතනයක වත්කම් හුවමාරුවක් නව ව්‍යාපෘතිය වෙත නොවිය යුතු බවට ආයෝජන මණ්ඩලය හා බැටික්ලෝ කැම්පස් පෞද්ගලික සමාගම අත්සන් කරන ලද ගිවිසුමෙහි ඇතුළත් වුවත්, පහත කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නව ව්‍යාපෘතියක් නොවන බැව් අනාවරණය වන අතර, ඒ පිළිබඳ සැලකිලිමත්වීමකින් තොරව ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදි තිබුණි.

I. ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබු ඇමුණුම 28හි දැක්වෙන අයදුම්පත්‍රයෙහි බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගම නමින් වු නිල මුද්‍රාවක් තබා තිබීම තුළ උක්ත ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වී ඇති සමාගම ඒ වනවිටත් ලියාපදිංචිව පැවති සමාගමක් බව ගම්‍ය විම.

II. නිරීක්ෂණ අංක 05 හි වු පරිසර අධිකාරියෙන් යොමුකර තිබු ලිපියට අනුව 2015 වර්ෂයේ මුල් භාගය තුළ පරිසර අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කරන අවස්ථාව වනවිටත් ව්‍යාපාතියේ ඉදිකිරීම් ආරම්භ කර තිබීම නිසා එය නව ව්‍යාපෘතියක් නොවීම.

III. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස ලියාපදිංචි විමට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රය සමඟ හිරා පදනම විසින් වෘත්තිය පුහුණු අමාත්‍යාංශය සමඟ වූ අවබෝධතා ගිවිසුමක් මත 2013 වර්ෂයේදි පිහිටුවන ලද මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙහි ආකෘතිය හා උක්ත අවබෝධතා ගිවිසුම යන ලියවිලි ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිම තුළ මෙකී ව්‍යාපෘතිය මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය නම් වූ තනි පුද්ගල ව්‍යාපාරයෙහි දිගුවක් ලෙස ගම්‍ය විම.

IV. බැටික්ලෝ කැම්පස් කොලේජ් පුද්ගලික සමාගමේ සභාපති හිස්බුල්ලා මහතා විසින් 2015 දෙසැම්බර් 04 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල් ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙහි ව්‍යාපෘතිය සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 50 ක් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන බවත්, ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් දැනටමත් ආරම්භ කර ඇති බව දක්වා තිබීම තුළ ආයෝජන මණ්ඩලයෙහි අනුමැතියට පෙර ව්‍යාපෘතිය ආරම්භ කර ඇති බව ගම්‍ය වීම.

V. යෝජිත ව්‍යාපෘතිය ආයෝජන මණ්ඩල ව්‍යාපාතියක් ලෙස ලියාපදිංචි වීම සඳහා හිරා පදනමේ සභාපති හිස්බුල්ලා මහතා විසින් දෙවන වරට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ දිනයේදීම අයදුම්පත්‍රයෙහි වූ තොරතුරු සම්බන්ධයෙන් කිසිදු ඇගයිමකින් තොරව ව්‍යාපෘතියට අදාළ ව්‍යාපාර ආයතනය සංස්ථාගත කිරීම සඳහා ආයෝජන මණ්ඩල විසින් අනුමැතිය ලබාදි ඇති අතරම සමාගමේ කෙටුම්පත් සාංගමික ව්‍යවස්ථාවලියෙහි පිටපතක් මණ්ඩලයෙහි සහකාර අධ්‍යක්ෂ (නීති) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලෙස දැනුම් දී තිබුණි. කෙසේ නමුත් මෙම දැනුම්දීම් ලිපියේ දිනය වූ 2015 ජුලි 17 දින වනවිටත් එනම් ජූලි 14 දින ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වී ඇති බැටික්ලෝ කැම්පස් කොලේජ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමාගම් රෙජිස්ටාර්වරයා විසින් පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කර තිබුණි.

8.3.7 ඉහත අංක 7.3.1 සිට අංක 7.3.6 දක්වා වූ නිරීක්ෂණ අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීතිරීති රෙගුලාසි හා පරිචයන්ට අනුකූල නොවන සේ අත්‍යවශ්‍යයෙන්ම ලබාගත යුතුව තිබූ නිෂ්කාශනයන්ගෙන් තොරව පූර්ව සංස්ථාපනය වූ හා අඩක් නිම කර තිබූ ව්‍යාපෘතියක් නව ව්‍යාපෘතියක් ලෙස අරුත් ගන්වා ආයෝජන මණ්ඩලය තුළ ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම තුළින් බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම ආනයනය කරන ලද අවස්ථා 143 කදී භාණ්ඩ මත එකතු වටිනාකම රු.මිලියන 48.51 ක බදු නිදහසක්ලබාදීමට (ඇමුණුම - 82) ආයෝජන මණ්ඩලය කටයුතු කර තිබුණි.

8.3.8 ලියාපදිංචිය සඳහා සලකා බලන ලද දෙවන අයදුම්පත්‍රය තුළ දක්වා ඇති ව්‍යාපෘතියෙහි මුළු ආයෝජනය ඇමරිකන් ඩොලර් මිලියන 4.75 ක් වුවත්, ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපාතිය තුළ 2018 අගෝස්තු 15 දින වන විට ඩොලර් මිලියන 24.64 ක් ආයෝජනය කර තිබුණි. ආයෝජන මණ්ඩල පරිචයන්ට අනුව ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු වුවත්, ආයෝජන මුදල්, ව්‍යාපෘතිය වෙත ලැබුණු ආකාරය පිළිබඳව මණ්ඩලය විසින් කිසිදු විමසීමක් සිදුකර නොතිබුණි.

ඡේදය සඳහා ආයෝජන මණ්ඩලය විසින් ලබාදී ඇති පිළිතුර

අනුමැතිය ලබාදුන් ආයෝජනයෙහි වටිනාකමට වඩා වැඩි මුදලක් යම් ව්‍යාපෘතියක ආයෝජනය කිරීමට ආයෝජකයා සූදානම් නම් මණ්ඩලය එය ව්‍යාපෘතියේ ධනාත්මක ලක්ෂණයක් ලෙස සලකනු ලබන අතර, සමස්ථ ආයෝජන මුදල සම්බන්ධයෙන් මණ්ඩලය සොයා බලනු ලබන්නේ වාණිජ කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුවය. (ඇමුණුම -80)

8.3.9 ව්‍යාපෘතියට අනුමැතිය ලබාදීම සනිටුහන් කරමින් කළමනාකාර අධ්‍යක්ෂ, හිරා පදනම වෙත 2016 ජනවාරි 12 දිනැතිව ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කර ඇති කොන්දේසි මාලාවේ 10 වැනි වගන්තිය තුළ තීරුබදු රහිතව ආනයනය කිරීමට යෝජිත හා බදු සහන ලබාගත හැකි දේශීයව මිලදීගනු ලබන භාණ්ඩ ප්‍රමාණයන් හා වර්ගයන් සම්බන්ධ උපලේඛන 02 ක් ගිවිසුම අත්සන් කිරීමට දින 14 කට පෙර මණ්ඩලය වෙත ලබාදිය යුතු බව දන්වා ඇතත් එවැනි මිලදීගැනීම් / ආනයන හා ඒවායේ ප්‍රමාණයන් සම්බන්ධ විධිමත් ලේඛන මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

8.4 ලංකා බැංකුවේ ඉතුරුම් ගිණුම් හරහා බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම හා ඊට අනුබද්ධ ආයතන වෙත ලද මුදල් ප්‍රේෂණයන් ලැබීම.

---

8.4.1 වර්ෂ 2017 අංක 17 හා 1986 අංක 02 දරන විනිමය පාලන පනත ප්‍රකාරව විදේශ විනිමය පාලන නීතිරීති සකස් කිරීම හා සංශෝධනය සඳහා මහ බැංකු වෙත පැවරී ඇති බලතල අනුව මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 01/2017 හි 08 වැනි වගන්තිය ප්‍රකාරව (ඇමුණුම - 83) සියළුම විදේශීය මුදල් මිලදීගැනීම හා විකුණුම් සම්බන්ධ විස්තර මාර්ගෝපදේශයෙහි ඇමුණුම් ලෙස නිකුත් කර ඇති ආකෘතිය අංක I හා II මගින් මහ බැංකුව වෙත වාර්තා කළ යුතු වුවත්, මඩකලපුව කැම්පස් පෞද්ගලික සමාගම හා ඊට අනුබද්ධිත ආයතන වෙත බැංකු ගිණුම් 04 ක් මගින් එකතු වටිනාකම රු.3,669,977,451.55කට අදාළ විදේශ විනිමය ලැබීම් අවස්ථා 21 සම්බන්ධයෙන් මහ බැංකුව දැනුවත් කර නොතිබුණි. (උපලේඛන අංක 03)

ඡේදය සඳහා ලංකා බැංකුව විසින් ලබාදී ඇති පිළිතුර

යම් වාණිජ බැංකුවකට මුදල් තැන්පත් කිරීමේදී එම මුදල් ලද මූලාශ්‍ර සහ පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබාගැනීම එම තැන්පතු භාර ගන්නා බැංකුවේ වගකීම වන අතර එය ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයයි. ඒ අනුව ඉහත දැක්වූ ජාත්‍යන්තර බැංකු හරහා එන ප්‍රේෂණ සඳහා ලබාගත් මුදල් නීත්‍යානුකූල මූලාශ්‍රවලින් ලද මුදල් ලෙස සලකනු ලැබිය හැක. ඒ අනුව අරමුදල්වල මූලාශ්‍රය පිළිබඳව සොයා බැලීමේ අවශ්‍යතාවක් ලංකා බැංකුව වෙත පැන නොනගියි.

එන ප්‍රේෂණ හරහා ලද මුදල්, ප්‍රේෂණවල සඳහන් අකාරයට අදාළ ප්‍රතිලාභි ගිණුම්වලට ලංකා බැංකුව විසින් බැර කර ඇත. එසේම එම මුදල් යොදාගනු ලබන අරමුණු පිළිබඳව ලංකා බැංකුව විසින් සැලකිලිමත් වී ඇත. එහිදී එන ප්‍රේෂණ මුදල් ලද ගිණුම් ආරම්භ කිරීමේදී ඊට සම්බන්ධ බැංකු ශාඛාවල කළමනාකරුවන් විසින් නිවැරදි ලෙස ගිණුම් විවෘත කිරීමේ අරමුණු හඳුනාගත් ආකාරයට මුදල් ලැබී ඇත්තේ විශ්ව විද්‍යාලයක් ඉදිකිරීම සඳහා බවත්, ඒ අනුව විශ්ව විද්‍යාලයක් ඉදිවෙමින් පැවති බැවිනුත් එම මුදල් අදාළ අරමුණු වෙනුවෙන් භාවිතයට ගෙන ඇති බවටත් නිරීක්ෂණය කර ඇත. (ඇමුණුම -84)

8.4.2 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව මහ බැංකුව විසින් 2016 ජනවාරි 27 දිනැතිව අංක 1951/13 දරන ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රීති සංග්‍රහයේ 59 (ආ) වගන්තිය ප්‍රකාරව (ඇමුණුම - 85) ව්‍යාපාර සම්බන්ධතා සඳහා ඇතුල්වීමට අයදුම් කර ඇති තැනැත්තා දේශපාලන පසුබිමක් සහිත පුද්ගලයෙකු වන අවස්ථාවකදී අදාළ ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීමට පෙර මූල්‍ය ආයතනය විසින් එහි පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඒ.එල්.එම්.හිස්බුල්ලා හා හිරාස් හිස්බුල්ලා යන දේශපාලන පසුබිමක් සහිත පුද්ගලයන්ගෙන් සමන්විත ආයතනයන් බැංකු ගිණුම් හරහා (ඉහත පසුබිම් තොරතුරු අංක 01 හි සඳහන් බැංකු ගිණුම් 14 වෙනුවෙන්) ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමේදී උක්ත වගන්තිය ප්‍රකාරව ලංකා බැංකුව එහි පාලක මණ්ඩලය වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

නිරීක්ෂණයට අනුව උක්ත බැංකු ගිණුම් 14 සඳහා ලංකා බැංකු පාලක සභාවෙහි අනුමැතිය ලබාගෙන නොමැති බව ලංකා බැංකුව පිළිගන්නා අතර, බැංකු ගිණුම් 04 ක් වෙනුවෙන් පමණක් ඉහළ කළමනාකරණ අනුමැතිය ලබාගෙන ඇති බවත්, අනෙක් ගිණුම් 10 වෙනුවෙන් ඉහළ කළමනාකරණ අනුමැතියක් හෝ ලබාගෙන නොමැති බව ලංකා බැංකුව විසින් තහවුරු කර ඇත. (ඇමුණුම -84)

8.4.3 උක්ත රීති සංග්‍රහයේ 59 (ඇ) වගන්තිය ප්‍රකාරව දේශපාලන පසුබිමක් සහිත තැනැත්තෙකු විසින් පවත්වාගෙන යන ගිණුම් වෙත ලැබෙන අරමුදල් සම්බන්ධයෙන් අරමුදල් මූලාශ්‍ර හා ප්‍රතිලාභී හිමිකාරිත්වය යෝග්‍ය ක්‍රම මගින් අදාළ මූල්‍ය ආයතනය විසින් තහවුරු කරගත යුතු වුවත්, දේශපාලන පසුබිමක් සහිත හිස්බුල්ලා පවුලේ කළමනාකාරිත්වයෙන් යුත් ව්‍යාපාර ආයතන 04 ක බැංකු ගිණුම් වෙත අවස්ථා 30 කදී ලැබී තිබූ රු.4,123,895,832 ක අගයකින් යුත් විදේශීය ප්‍රේෂණයන් ලැබෙන මූලාශ්‍රය, එහි අරමුණු හා නෛතිකත්වය සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රම මගින් තොරතුරු ලබාගෙන නොතිබුණි. මෙම නිරීක්ෂණය සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් ලංකා බැංකුව විගණනය වෙත ලබාදී නැත.

8.4.4 මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා වූ මහ බැංකු රීති සංග්‍රහයේ 59 (ඇ) වගන්තියෙහි සඳහන් දේශපාලන පසුබිමක් සහිත පුද්ගලයන් සමඟ පවතින ව්‍යාපාර සම්බන්ධතා අඛණ්ඩව නියාමනය කළ යුතුය යන වගන්තියට අනුකූල වීම සඳහා ලංකා බැංකු කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ 2018/25 හි අංක 12.1 මගින් (ඇමුණුම - 86) දේශපාලන පසුබිමක් සහිත පුද්ගලයෙකුගේ ගනුදෙනු සම්බන්ධයෙන් වැදගත් වන තොරතුරු සෑම මාස 06 කට වරක් විමර්ශනය කර ගනුදෙනුකරු විමසා එකඟතාවය ලබාගෙන සටහන් කරගත යුතු වුවත්, දේශපාලන පසුබිමක් සහිත හිස්බුල්ලා පවුල හා සම්බන්ධ උක්ත බැංකු ගිණුම් 14 වෙනුවෙන් එලෙස කටයුතු කර නොතිබුණි. උක්ත නිරීක්ෂණ හා ගැලපෙන පිළිතුරක් ලංකා බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කර නැත.

8.4.5 උක්ත මහ බැංකු රීති සංග්‍රහයේ 07 වගන්තිය අනුව ගනුදෙනුකරුගේ මූල්‍ය ගනුදෙනු ඔහුගේ ඉපයීම් මූලාශ්‍ර සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම සඳහා අඛණ්ඩ පදනමින් ව්‍යාපාරික සම්බන්ධතා නියාමනය කළ යුතු වන අතර, 38 වගන්තිය ප්‍රකාර බැලූ බැල්මට පෙනෙනා නීත්‍යානුකූල අරමුණක් නොමැති සියළු සංකීර්ණ හා අසාමාන්‍ය ගනුදෙනුවල පසුබිම හා අරමුණ පරීක්ෂා කර අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි බලධාරියා වෙත වාර්තා කළ යුතු අතරම රීතින්ට අනනුකූලවන්නා වූ මූල්‍ය ගනුදෙනු 39 වගන්තිය ප්‍රකාරව යෝග්‍ය පියවර ගැනීම සඳහා ආයතනයේ අනුකූලතා නිලධාරියා වෙත වාර්තා කළ යුතු වුවත්, මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගමේ ලංකා බැංකු ගිණුම් අංක 78495137 වෙත අවස්ථා 07 ක දී අසාමාන්‍ය ලෙස වරකට ඩොලර් මිලියන 2.8 කට (රු.බිලියන 4.1ක්) වඩා වැඩි මුදල් ප්‍රේෂණයක් ලැබී තිබියදී සංකීර්ණත්වයෙන් යුත් එකී අසාමාන්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් උක්ත රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. නිරීක්ෂිත කරුණු සම්බන්ධයෙන් ලංකා බැංකුව විගණනය වෙත නිසි පැහැදිලි කිරීමක් ලබාදී නොමැත.

8.4.6 මූල්‍ය ගනුදෙනු වාර්තා කිරිමේ පනත වෙනුවෙන් වූ මහ බැංකු රිති සංග්‍රහයේ 47(ඇ) වගන්තිය ප්‍රකාරව යම් ගිණුමක් වෙත තෙවන පාර්ශ්ව ගනුදෙනුකරුවෙකු විසින් වරකට රු.200,000 ඉක්මවන මුදල් තැන්පතු සිදුකරන අවස්ථාවන්හිදී, මුදල් තැන්පත් කරන්නාගේ නම, ලිපිනය, අනන්‍යතා අංකය, තැන්පතුවේ අරමුණ ආදි තොරතුරු බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු අතර බැංකුව විසින් තැන්පතු සම්බන්ධ තොරතුරු පරිගණක පද්ධතිය තුළ වූ අදාළ ක්ෂේත්‍ර තුල ඇතුළත් කළ යුතුය. එහෙත් අංක 7895137 දරණ බැටික්ලෝ කැම්පස් පෞද්ගලික සමාගමේ ගිණුම වෙත අවස්ථා 11 කදී තැන්පත් කරන ලද රු.59,975,000තැන්පතු වෙනුවෙන් තැන්පත්කරුගේ විස්තර ඇතුළත් කර නොතිබුණි. උක්ත තැන්පතු අවස්ථා 10 කදී නිරීක්ෂණය පරිදි අවශ්‍ය තොරතුරු ලබාගැනීමට ලංකා බැංකුව කටයුතු කර නොමැති බව ලංකා බැංකුව විසින් පිළිගෙන ඇත.

8.4.7 මහ බැංකු රිති සංග්‍රහයේ 97 වගන්තිය ප්‍රකාරව එක් ගනුදෙනුකරුවෙකු විසින් එකම මූල්‍ය ආයතනයක ගිණුම් දෙකක් හෝ වැඩි ගණනක් විවෘත කරනු ලබන අවස්ථාවක එවැනි ගිණුම් විවෘත කිරිම සම්බන්ධයෙන් වූ විශේෂිත හේතුව මූල්‍ය ආයතනය විසින් වාර්තා කළ යුතු වුවත්, එවැනි විශේෂ හේතු දැක්විමකින් තොරව මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම වෙත ලංකා බැංකුව වැලිකන්ද හා කොල්ලුපිටිය ශාඛාවන්හි බැංකු ගිණුම් ආරම්භ කිරිමට අවස්ථාව ලබාදී තිබුණි. මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගමේ විවිධ වූ කාර්යයන් වෙනුවෙන් එලෙස බැංකු ගිණුම් ආරම්භ කර ඇති බවත්, එකී කාර්යයන් විශේෂිත අරමුණු ලෙස හඳුනාගෙන ඇති බව ලංකා බැංකුව විගණනය වෙත දන්වා ඇත.

8.4.8 මහ බැංකු රීති සංග්‍රහයේ 54(1) වගන්තිය ප්‍රකාරව යම් සමාජ සේවා සංවිධානයක් විසින් මූල්‍ය ආයතනයක පවත්වාගෙන යන ගිණුම් වෙත ලැබෙන ප්‍රේෂණයන් තහනම් කරන සංවිධානයකින් හෝ පුද්ගලයින්ගෙන් නොවන බවට වග බලාගැනිම සඳහා ප්‍රේෂණයන්හි නීත්‍යානුකුල බව තහවුරු කර ගැනිම සඳහා මූල්‍ය ආයතනය විසින් සමාජ සංවිධානයේ වත්මන් සියළු සම්බන්ධතා සමාලෝචනය කර නියාමනය කළ යුතු වුවත්, හිරා පදනම නැමැති සමාජ සංවිධානය නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් අංක 1631952 සම්බන්ධයෙන් උක්ත වගන්තිය ප්‍රකාරව නියාමනය කර නොතිබුණි. කිසිදු නියාමයකින් තොරව පවත්වාගෙන ගිය උක්ත ගිණුම වෙත අවස්ථා 15කදී එකතු වටිනාකම රු.313,128,282 ක දේශීය හා විදේශීය ප්‍රේෂණ බැර කර තිබුණි. (උපලේඛන අංක 04) නිරීක්ෂණය හා අනුකූල වන පිළිතුරක් ලංකා බැංකුව විසින් ලබාදී නැත.

8.4.9 රීති සංග්‍රහයේ 24(1) වගන්තිය ප්‍රකාරව කිසිදු මූල්‍ය ආයතනයක් විසින් කිසිදු නිර්නාමිකව අසත්‍ය නමකින් හෝ ව්‍යාජ තැනැත්තෙකුගේ නමින් ගිණුමක් විවෘත නොකළ යුතු බව දක්වා ඇතත් ලංකා බැංකුව කාත්තක්කුඩි ශාඛාව විසින් මලික් අබ්දුල්ල බින් අබ්දුල් අසිස් මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය නමින් වූ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයකින් තොරව හා ලියාපදිංචි නොවූ ආයතනයක ලිපි ශිර්ෂයක් මගින් ඒ.එල්.එම්.හිස්බුල්ලා මහතා කර ඇති ඉල්ලීමකට (ඇමුණුම - 87) ප්‍රතිචාරිව ව්‍යාජ නමකින් ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදී තිබුණි. ලියාපදිංචි සහතිකයකින් තොරව ගිණුම් ආරම්භ කිරිමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු ලංකා බැංකුව විගණනය වෙත ලබාදී නැත.

8.4.10 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සඳහා මහ බැංකුව නිකුත් කර ඇති 2017 අප්‍රේල් 21 දිනැති නියෝගයන්හි 3 වගන්තියෙහි **II** ඡේදයෙහි(ඇමුණුම - 88) බැංකු හා මූල්‍ය සමාගම් සඳහා අදාළ වන පළමු උපලේඛනය මගින් සැක කටයුතු ගනුදෙනු මහ බැංකුව වෙත වාර්තා කළ යුතු අතරම එහි උපලේඛනයෙහි 37 ඡේදයෙහි දක්වා ඇති කරුණු පාදක කර ගනිමින් සැක කටයුතු ගනුදෙනු හඳුනාගත යුතු වුවත්, අසාමාන්‍ය ලෙස තැන්පත් කිරීම් හා ආපසු ගැනීම් වටිනාකම් සහිතව විශාල බාහිර ප්‍රේෂණයන් සහිතව අනන්‍යතාවය හා වෙනත් තොරතුරු හෙළිදරව් නොකළ හා ප්‍රේෂණයන්ගේ අරමුණු හා නිත්‍යානුකූලත්වය හඳුනානොගත් ව්‍යාපාර ආයතනයන්හි ගිණුම් 04 ක් වෙත අවස්ථා 25 ලද ප්‍රේෂණ වටිනාකම් සම්බන්ධයෙන් උක්ත උපලේඛනය මගින් මහ බැංකුව වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. මහ බැංකු රීති සංග්‍රහයේ වගන්ති අංක 37 හි පරිදි සැකය ස්ථාපිත නොවීම මත අදාළ තොරතුරු වාර්තා කර නොමැති බව ලංකා බැංකුව විගණනය වෙත දන්වා ඇත.

8.5 මඩකලපුව විශ්ව විද්‍යාලය වෙත උපාධි ප්‍රධානය කිරීමේ හැකියාව ලබාගැනීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ වූ ගණුදෙනු

---

රජයේ අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1824/21 හා 1891/9 හා SA නියෝග අංක 01/2013 ට පදනම්ව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ප්‍රනිතනය සඳහා සකස් කරන ලද උපදෙස් මාලාවෙහි (ඇමුණුම - 89) සඳහන් නිර්දේශයන්ට පටහැනිව මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයට උපාධි ප්‍රධාන හැකියාව ලබාදීම සම්බන්ධයෙන් පහත ඇගයීම් සිදු කර තිබුණි.

8.5.1 උක්ත උපදෙස්මාලාව අනුව අයදුම්පත්‍රය හා අදාළ ලියවිලි සමඟ රු.200,000 ක ආපසු නොගෙවන ගාස්තුවක් අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු අතර, ගෙවීම් ලැබීමෙන් පසු අදාළ

තොරතුරු සනාථ කළහැකි උපයෝගී ලේඛනයක් ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කර තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සමාලෝචනය (Desk Review) කළයුතු වුවත් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

8.5.2 එම සමාලෝචනයෙන් පසුව ආයතනික සමාලෝචනය සඳහා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාව පිටපත් 06 ක් සමඟ රු.500,000 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවිය යුතු වේ. පාඨමාලා සමාලෝචනයක් සිදු කිරීමට නිර්දේශ ලබාදීම හෝ ඒ සඳහා ගාස්තු අය කිරීම සඳහා ආයතනික සමාලෝචන නිර්නායකයන් හා උපමාන තෘප්ත විය යුතුය. උක්ත ගාස්තු අවස්ථාවන්ට අනුව ආයතනික සමාලෝචනය දක්වා අය කළහැකි ගාස්තු ප්‍රමාණය රු.700,000 ක් වුවත් ඊට අනුකූල නොවනසේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.1,000,000 ක ගාස්තුවක් අයකර තිබුණි.

8.5.3 පසුබිම් තොරතුරු තුළ සඳහන් පරිදි අවස්ථා 2 කදී විෂයය ප්‍රවේශයන්ගෙන් යුත් පංච පුද්ගල කමිටුවක් විසින් උක්ත ආයතනය වෙත උපාධි ප්‍රධානය කිරීමේ හැකියාව ලබාදීම සඳහා වූ ඇගයීම් නිර්නායකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් හා උසස් අධ්‍යාපන ආයතනයක් වෙනුවෙන් පැවතිය යුතු අත්‍යාවශ්‍ය ගුණාංග සහිත නිර්නායකයන් තෘප්ත වී නොමැති බැව් සිය පරීක්ෂණ වාර්තාව තුළ දක්වා තිබියදී එම ආයතනය වෙත උපාධි ප්‍රධානය කිරීමේ හැකියාව ලබාදිය නොහැකි බැව් හා සම්පූර්ණ කළයුතු අවශ්‍යතා සම්බන්ධයෙන් දැනුවත් කර නැවත සලකා බැලීම සඳහා නිර්දේශිත අඩුපාඩු සම්පූර්ණ කර නැවත අයඳුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස දන්වා උපාධි ප්‍රධානය කිරීමේ හැකියාව ලබාගැනීමට වූ යෝජනාව ප්‍රතික්ෂේප කළයුතු වුවත් නැවත නැවත කමිටු පත් කරමින් හා යම් යම් පැහැදිලි කිරීම් සඳහා ආයතනයෙන් වාර්තා කැඳවමින් ආයතනික සමාලෝචන කමිටුවේ නිර්දේශ නොසලකා හැර ඇගයීම් කිරීමට ප්‍රතීතන හා තත්ත්ව සහතික පිළිබඳ ස්ථාවර කමිටුව කටයුතු කර තිබුණි.

8.5.4 ආයතනික සමාලෝචනය සඳහා පංච පුද්ගල කමිටුව සලකා බලන ලද ක්ෂේත්‍රයන් අතර වූ භෞතික සම්පත්, අධ්‍යයන සැලසුම් හා ගුණාත්මකභාවය සහතික කිරීමේ ක්‍රියාවලිය මෙන්ම අධ්‍යයන පර්යේෂණ හා කාර්ය මණ්ඩල නිපුණතා සහ ක්ෂේත්‍රයන් ඉතා දුර්වල හා පිළිගත නොහැකි තත්ත්වයක පවතින බැව් නිර්දේශ කර තිබියදී එම ක්ෂේත්‍රයන් නැවත සලකා බැලීමකින් තොරව හා වැඩිදියුණු කර ඇති බවට කිසිදු සාක්ෂියකින් තොරව උක්ත ආයතනයෙහි අයඳුම්පත්‍රය 2017 නොවැම්බර් 24 දින පාඨමාලා සමාලෝචනය සඳහා යොමුකර තිබුණි. (ඇමුණුම - 90)

8.5.5 ප්‍රතීතන හා තත්ත්ව සහතික සඳහා වූ ස්ථාවර කමිටුව විසින් පාඨමාලා සමාලෝචනය සඳහා පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුව විසින් 2018 මැයි 08 දිනැතිව අතුරු වාර්තාවක් (ඇමුණුම - 91) හා 2018 ජූලි 04 දින අවසන් වාර්තාව ලබා දී තිබුණි. ආයතනික සමාලෝචන වාර්තාව තුල පාඨමාලා හා ඉගැන්වීම් සම්බන්ධයෙන් වූ ක්ෂේත්‍රයන් ඉතා අයහපත් බවට නිර්දේශ පැවතියදී උක්ත පාඨමාලා සමාලෝචන වාර්තාව තුල යෝජිත පාඨමාලා ඇගයීම් නිර්නායකයන් සතුටුදායක බවට නිර්දේශ ලබා දී තිබුණි.

8.5.6 උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසු වෘත්තීය ප්‍රවීනතාවයක් සහිත මානව සම්පත් යෝජිත ආයතනය සතු නොවන බවට වූ ආයතනික සමාලෝචන වාර්තාවේ නිර්දේශයෙන් පසුව මඩකලපුව කැම්පස් පුද්ගලික සමාගම විසින් බඳවාගැනීමට යෝජිත දේශකවරුන් 45 ගේ සුදුසුකම් සහිත නම් ලයිස්තුවක් (ඇමුණුම - 92) අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ නමුත් උක්ත ලැයිස්තුවෙහි වූ දේශකවරුන් යෝජිත උසස් අධ්‍යාපන ආයතනයෙහි සේවය කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශිත ලිපි ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එකී ලැයිස්තුව හුදු නම් ලැයිස්තුවක් පමණක්ද යන්න ප්‍රශ්ණගත වුවද, ඒ පිළිබඳ සැලකිල්ලක් දැක්වීමකින් තොරව විෂය නිර්දේශ ඇගයීම් කමිටුව සිය නිර්දේශයන් ලබා දී තිබුණි.

8.5.7 2016 අගෝස්තු 15 දිනෙන් පසුව බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය අතර වූ අවබෝධතා ගිවිසුම අවසන් වී තිබූ අතරම, වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව තුළ බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගමේ ලියාපදිංචිය ද අලුත් කර නොතිබුණි. එහෙත් බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම 2019 අප්‍රේල් දක්වා අඛණ්ඩව අධ්‍යයන කටයුතුවල නියැලුණු බවට තොරතුරු ලැබී ඇති අතර, එලෙස අධ්‍යයන කටයුතු පවත්වාගෙන යන අතරතුර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පත්කළ කමිටුවක් මගින් උපාධි ප්‍රදානය කිරීමේ හැකියාව ලබාගැනීම සඳහා වූ යෝග්‍යතාවය පරීක්ෂා කිරිම සඳහා කිහිපවරක් බැටික්ලෝ කැම්පස් පුද්ගලික සමාගම වෙත පැමිණ තිබුණි. කෙසේ නමුත් 2016 – 2019 කාලය තුළ සමාගම විසින් පවත්වාගෙන ගිය පාඨමාලාවල ස්වභාවය, පාඨමාලා සඳහා බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව, පාඨමාලා අන්තර්ගතය හා එහි ගුණාත්වය හා එකී පාඨමාලා උපාධි තත්ත්වය හා සම තත්ත්වයේ පවතින්නේද යන්න කිසිදු පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. 2016 -2019 කාලය තුළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විධිමත් අවසරයකින් තොරව උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවාගෙන අධ්‍යාපනය ලබාදුන් බවට විගණනය වෙත තොරතුරු ලැබී ඇත.

8.5.8 මඩකලපුව කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත මහවැලි ඉඩම දීර්ඝකාලීනව බද්දට ලබාගත හැකි බැව් ඇගවීම සඳහා එහි කළමණාකාරීත්වය විසින් කෙටුම්පත් දීර්ඝකාලීන බදු ඔප්පුවෙහි පිටපතක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ අතර එම කෙටුම්පත් බදු ඔප්පුවෙහි විෂය භාර ලිපිකරුවන් දෙදෙනෙකු හා බදු ගැණුම්කරු වන හිස්බුල්ලා මහතා අත්සන් කර තිබුණි. නීතිමය ලියවිල්ලක් ලෙස සම්පූර්ණ නොවූ ලිපිගොනුවේ වූ ලිපියක් (ඇමුණුම - 93) අනීතිකව විෂයභාරව කටයුතු කළ පුද්ගලයන් හා බදුකරු විසින් භාවිතා කර ඇති බැව් නිරීක්ෂණය වන අතරම අමාත්‍යාංශය විසින් උක්ත අනීතික ලිපිය ලිපිගොනුවට ඇතුලත් කර ඇගයීම් සඳහා යොදාගෙන තිබුණි.

8.6 රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචිය සඳහා හිරා පදනම විසින් ඉල්ලීම් කර තිබීම සම්බන්ධ නිරීක්ෂණ

---

8.6.1 ඉහත පසුබිම් තොරතුරු අනුව හිරා පදනම රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර නොතිබියදී අවස්ථා ගණනාවකදී හිරා පදනම රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස හුවා දක්වමින් විවිධ රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කර තිබුණි.

8.6.2 බුද්ධි කාර්යාංශය විසින් හිරා පදනමෙහි සාමාජිකයින් සම්බන්ධයෙන් අහිතකර වාර්තා පවතින බැවින් හිරා පදනම වෙත බුද්ධි අංශ නිශ්කාශන ලබාදී නොතිබියදී හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර තිබියදී ආයතනයෙහි පසුබිම සම්බන්ධ පරීක්ෂාවකින් තොරව හිරා පදනම වෙත උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් හිරා පදනම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.

8.7 මඩකලපුව විශ්වවිද්‍යාල විද්‍යායතනය පවත්වාගෙන යාම සඳහා කාන්තන්කුඩි නගර සභාව වෙතින් ගොඩනැගිල්ලක් බද්දට ගැනීම.

---

8.7.1 නගර සභා ආඥා පනතේ 36(ඉ) වගන්තිය ප්‍රකාරව සභාව සතු දේපලක් බදුදීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර ආඥා පනතේ 39(1) වගන්තිය ප්‍රකාරව(ඇමුණුම - 94) රු.10,000 කට වැඩි ගිවිසුම්වලට එළැඹීමේදී සභාපතිවරයා විසින් සභාවේ අනුමැතිය ලබාගත යුතු වේ. එහෙත් මඩකලපුව විශ්ව විද්‍යාලය වෙත වර්ග අඩි 11,000 ක වපසරිය සහිත නගර සභා ගොඩනැගිලි බදු දීමට 2014 මැයි 10 දින ගිවිසුම් ගත වීමට පෙරාතුව උක්ත වගන්ති ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගෙන් හා සභාවේ අනුමැතිය ලබාගැනීමට සභාපතිවරයා කටයුතු කර නොතිබුණි.

8.7.2 රාජ්‍ය ගොඩනැගිලි බදුදීමක දී රජයේ තක්සේරුකරු මගින් බදු කුලී සම්බන්ධ තක්සේරු වාර්තාවක් කැඳවා තක්සේරු අගයක් මත මාසික බදු කුලිය තීරණය කළයුතු වුවත් එවැනි තක්සේරු වාර්තාවක් කැඳවීමකින් තොරව හා කිසිදු සාධාරණ පදනමකින් තොරව වර්ග අඩි 11,000 ක ගොඩනැගිලි සඳහා මසකට රු.5,000 ක බදු කුලියක් වෙනුවෙන් ගිවිසුම් ගත වීමට සභාපතිවරයා කටයුතු කර තිබුණි.

8.7.3 ගොඩනැගිලි බදු ගැනීම සඳහා මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනයෙන් ඉල්ලීම් කර තිබූ දිනය 2014 නොවැම්බර් 18 වුවත් (ඇමුණුම - 95) ඊට පෙර දිනයක් වූ 2014 මැයි 10 දින ගොඩනැගිල්ල බදුදීම සඳහා ගිවිසුම් ගත වී තිබුණි. කෙසේ නමුත් බදු ගිවිසුම අත්සන් කළ දින වන විටත් කිසිදු නීත්‍යානුකූල අවසරයකින් තොරව උක්ත ගොඩනැගිලි මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය භුක්ති විඳ තිබූ බව නිරීක්ෂණය විය.

8.7.4 නීත්‍යානුකූල හා විධිමත් ඉඩම් බදු දීමකදී නීති නිලධාරියෙකු විසින් බදු ගිවිසුම සකස් කර ඔහු ඉදිරියේදී බදු ගිවිසුම අත්සන් කළයුතු වුවත් ගිවිසුම් සකස් කිරීමේදී නීති නිලධාරියෙකුගේ සේවය ලබාගෙන නොතිබුණි.

8.7.5 ගිවිසුම්ගත බදු ගොඩනැගිල්ල 2018 මාර්තු දක්වා මාස 47 කාලයක් බදුකරු විසින් භුක්ති විඳ තිබූ අතර ගෙවා තිබූ බදු මුදල රු. 155,000 කි. තක්සේරු දෙපාර්තමේන්තු තක්සේරු වාර්තාව අනුව උක්ත ගොඩනැගිලි වෙනුවෙන් රු.197,500 ක මාසික බදු කුලියක් අය කළයුතුව තිබීම හේතුවෙන් බදුකරුගෙන් අයවිය යුතුව ඇති හිඟ බදු මුදල රු 8,475,000 බව නිරීක්ෂණය විය. හිඟ බදු මුදල් ගෙවන ලෙස බදුකරු වෙත 2017 අගෝස්තු 24 දින දන්වා යවා ඇතත් මෙතෙක් එම හිඟ බදු මුදල් ගෙවා නොමැති බව නිරීක්ෂණය විය.(ඇමුණුම - 96)

8.7.6 තක්සේරු වාර්තාවක් රහිතව මෙන්ම විධිමත් ක්‍රමවේදයක් භාවිතා නොකොට මාසික බදු වටිනාකම තීරණය කිරීම හා විධිමත් අනුමැතියකින් තොරව සභාවේ දේපල බදු දීමට ක්‍රියා කිරීම තුළ නගර සභාවේ සභාපතිවරයා තම බලය අභිබවා කටයුතු කිරීමෙන් නගර සභාව වෙත රු.8,475,000 පාඩුවක් සිදු කිරීමට කටයුතු කර ඇති බැව් නිරීක්ෂණය විය.

8.8 බදු ඉඩමේ ගොඩනැගිලි ඉදිකිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් වාකරේ ප්‍රාදේශීය සභාවේ කාර්ය භාරය.

---

8.8.1 පසුබිම් තොරතුරු අංක 6.8.1 හි සඳහන් බදු ඉඩම තුල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ ගොඩනැගිලි සැලැසුම් අනුමත කරවා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය 2014 අගෝස්තු 26 දින

ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගෙන තිබූ නමුත් ඊට පෙර එනම් 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දීමකින් හෝ අනුමැතිය ලබාගැනීමකින් තොරව උක්ත ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි.

8.8.2 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත හා ඊට අදාළ 1982 අංක 04 දරන සංශෝධනය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනත ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් පහත සඳහන් අනනුකූල තත්වයන් නිරීක්ෂණය විය (ඇමුණුම - 97 හා 98)

(I) ව්‍යාපෘතියෙහි වූ ගොඩනැගිලි සංකීර්ණය තුල ගොඩනැගිලි 16 ක් හඳුනා ගත හැකි වුවත් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති ගොඩනැගිලි සංඛ්‍යාව 2 ක් වීම තුල අනවසර ඉදිකිරීම් වැලැක්වීම හා නියාමනය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව නිසි උද්යෝගයෙන් සිය වගකීම් ඉටු කර නොතිබුණි.

(II) ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් ලද අයදුම් පත්‍රය හා සබැඳිව විමර්ශනය කර අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට විෂය ප්‍රවීනයන්ගෙන් යුත් කමිටුවක් පත්කර නොතිබුණි.

(III) අයදුම්පත්‍රය ලද වහාම ස්ථානීය පරීක්ෂාවක් සඳහා තාක්ෂණික නිලධාරියෙක් යොදවා වාර්තාවක් කැඳවිය යුතු වුවත් එවැන්නක් සිදුකර නොතිබුණි.

(IV) අයදුම්පත්‍රය සමඟ පරිසර වාර්තාවක් කැඳවා නොතිබුණි.

(V) ව්‍යාපෘතියේ යෝජිත ගොඩනැගිලි වල වපසරිය මත පදනම්ව ගාස්තු අය කළ යුතු වුවත් එවැනි කිසිම පදනමකින් තොරව, රු.8,262.50 ක ගාස්තුවක් අය කර තිබුණි.

(VI) අවස්ථා 50 කට වැඩි වාර ගණනකදී වරින් වර සංශෝධිත ගොඩනැගිල්ලේ සැලසුම් ඉදිරිපත් කර ඇතත්, සංශෝධිත සැලැසුම් පරීක්ෂාව සඳහා අවස්ථා 2කදී පමණක් රු.15,000 ක් හා රු.5,000 ක් බැගින් සංශෝධිත සැලැසුම් පරීක්ෂණ ගාස්තු අය කර තිබුණි.

(VII) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා උක්ත විෂයට අදාළව ලිපිගොනුවක් පවත්වා ගැනීමකින් තොරව සාමාන්‍ය පරිචයන් හා ක්‍රමවේද භාවිතයකින් තොරව යෝජිත ව්‍යාපෘතියේ සමස්ථ සැලැස්ම තුල දින රහිතව සිය අත්සන යොදා අවිධිමත් ලෙස හා පෞද්ගලිකව අනුමැතිය ලබා දීමට එවකට විෂය භාර තාක්ෂණ නිලධාරියා හා සභා ලේකම් කටයුතු කර තිබුණි.

8.8.3 නිරීක්ෂණ අංක 02 (VII) හි සඳහන් පරිදි අවිධිමත්ව හා ආයතනික ක්‍රමවේදයන්ගෙන් තොරව පෞද්ගලික මට්ටමින් උක්ත ව්‍යාපෘතියේ ස්මස්ථ ගොඩනැගිලි සැලැස්ම තුල සිය අත්සන යොදා අනුමැතිය ලබා දී තිබූ තාක්ෂණික නිලධාරියා හා සභා ලේකම් සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්, මඩකලපුව විසින් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව නිරීක්ෂණය විය. (ඇමුණුම - 99 හා 100) කෙසේ නමුත් එලෙස අවිධිමත් අනුමැතිය ලබා දීමට මුල්වූ සභා ලේකම්වරයා විධිමත් නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශ ගත වී ඇත. (පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් කොමසාරිස්වරයා විසින් ඔහුට වැටුප් රහිත නිවාඩු අනුමත කර නැත.)

9. නිර්දේශ

-----------

9.1 වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

---------------------------------------------------------------------------

9.1.1 උසස් අධ්‍යාපන ආයතනය ලියාපදිංචි කිරීමේදි සපුරා තිබිය යුතු නිර්ණායකයන් සම්පූර්ණ කර නොතිබීම සහ නීතිරීති රෙගුලාසි හා පරිචයන්ට අනනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(යොමුව - 8.1)

9.1.2 වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා හිරා පදනම අතර ඇති කරගෙන තිබු අවබෝධතා ගිවිසුමෙහි නෛතිකත්වය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිෂ්කාශන ලබාගැනීම හා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ අවධානය යොමුකිරීම.

(යොමුව - 8.1.7,8.1.4)

9.1.3 පාඨමාලා විෂය නිර්දේශ ආවරණයන්, ඇගයීම් තොරතුරු, සහතිකපත්‍ර නිකුත් කිරීම සඳහා වූ නිර්දේශයන් හා අනුමැතීන්ට අදාළ ලිඛිත සාක්ෂි නොමැතිව පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍යයන් 49 දෙනෙකු වෙත NVQ සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(යොමුව - 8.1.7,8.1.4)

9.1.4 තරුණ කටයුතු අමාත්‍යාංශය මගින් හිරා පදනමේ සහභාගීත්වය මත මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය පිහිටුවන ලද බව ඇඟවෙන පරිදි රජයට අනුබද්ධ විශ්ව විද්‍යාලයක් ලෙස පෙනී සිටිමින් පාඨමාලා සඳහා සිසුන්ට ආරාධනා කිරීම සම්බන්ධයෙන් අදාල විද්‍යායතනයෙහි

කළමනාකරණය සම්බන්ධයෙන් සහ විධිමත් අනුමැතියකින් තොරව රාජ්‍ය ලාංඡනය භාවිතා කිරීම පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිම .

(යොමුව - 8.1.12)

9.1.5 වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචිය හා නියාමනය සඳහා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් ස්ථාපිත නිතීරීති රෙගුලාසි හා පරිචයන් සමාලෝචනය කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් මෙන්ම නෛතික රාමුව යථාවත් කිරීම.

(යොමුව - 8.1.8, 8.1.13)

9.2 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

-----------------------------------

9.2.1 ඉහත 8.3.1, 8.3.3, 8.3.4, 8.3.5, 8.3.8, හා 8.3.9 ඡේදයන්හි දක්වා ඇති විගණන නිරීක්ෂණයන් මඟින් පෙන්වා දී ඇති නීතිරීති රෙගුලාසි හා සම්මත පරිචයන්ට අනනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

9.2.2 ආයෝජන මණ්ඩලය තුල සාමාන්‍යයෙන් ව්‍යාපෘතියක් ලියාපදිංචිය සඳහා යොදාගන්නා නිර්ණායකයන්ගෙන් බැහැරව උක්ත ව්‍යාපෘතිය ලියාපදිංචි කර තිබීම හා ආනයන තීරුබදු සහන ලබාදීම සඳහා වන නිර්ණායකයන් සම්පූර්ණ කර නොතිබියදී උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදී ඇති රු.මිලියන 48.51 ක ආනයන තීරුබදු සහනය නැවත අය කර ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම.

(යොමුව - 8.3.7)

9.2.3 ආයෝජන මණ්ඩලය හා බැටික්ලෝ කැම්පස් ලිමිටඩ් ආයතනය අතර අත්සන් කරන ලද ගිවිසුමෙහි නෛතිකත්වය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිෂ්කාශන ලබාගැනීම පිළිබඳව සලකා බැලීම

(යොමුව - 8.3.6,8.3.2)

9.3 ලංකා බැංකුව

----------------

9.3.1 මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව ප්‍රකාශයට පත්කර ඇති රීති සංග්‍රහයට අනුකූලව සැක කටයුතු ගනුදෙනු හා ඉහළ අගයන්ගෙන් යුත් ආමුක ප්‍රේෂණයන් සම්බන්ධයෙන් මහබැංකුවට වාර්තා නොකිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

(යොමුව - 8.4.1, 8.4.2, 8.4.3, 8.4.4, 8.4.5)

9.3.2 මුදල් ගනුදෙනු හා විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් නීතිරීති රෙගුලාසි හා මහ බැංකු චක්‍රලේඛයන් ප්‍රකාරව ආමුක ප්‍රේෂණ සඳහා වන ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුගතවීම සහ ශක්තිමත් කිරීම.

(යොමුව - 8.4.6, 8.4.7, 8.4.8, 8.4.9, 8.4.10 )

9.4 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

------------------------------

9.4.1 1947 අංක 08 දරණ ඉඩම් ආඥා පනත හා එම පනත බලාත්මක කිරීම සඳහා පනවන ලද රෙගුලාසිවලට අනුකූල නොවන සේ වගකීම් විරහිතව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ ඊට අදාල නිලධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(යොමුව - 8.2.2 )

9.4.2 මඩකලපුව කැම්පස් ලිමිටඩ් ආයතනය වෙත මහවැලි ඉඩම් දීර්ඝකාලීනව බදුදීම සඳහා අත්සන් කරන ලද බදු ගිවිසුම්වල නෛතිකත්වය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තු නිෂ්කාශන ලබාගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම.

(යොමුව - 8.2.12 )

9.4.3 මහවැලි ඉඩම් බදුදීම සම්බන්ධයෙන් වන නීතිරීති රෙගුලාසි සම්මතයන් හා පරිචයන් සමාලෝචනය කර වැඩිදියුණු කිරීම.

(යොමුව - 8.2.1, 8.2.4 ,8.2.8, 8.2.9 )

9.5 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

---------------------------------

9.5.1 උසස් අධ්‍යාපන ආයතනයන් ඇගයීම සඳහා වූ ආයතනික සමාලෝචනය අසමත් වී තිබියදී සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව මඩකලපුව විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙත සුවිශේෂී වන සේ පාඨමාලා සාමලෝචනයන් සිදුකිරීමට හේතු වූ කරුණු පිළිබඳව පරීක්ෂා කර සුදුසු පියවර ගැනීම

(යොමුව - 8.5 )

9.5.2 උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචිය සඳහා වන සුදුසුකම් හා ඇගයිමට ලක්වන ක්ෂේත්‍රයන් මෙන්ම නිර්ණායකයන් සමාලෝචනය කර අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදුකිරීම.

(යොමුව - 8.5.3,8.5.4 )

9.6 කෝරලේපත්තු උතුර - වාකරේ ප්‍රාදේශිය සභාවේ

---

9.6.1 ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වූ ලිපිගොනුවක් තුල සාමාන්‍ය පරිචයන් හා ක්‍රමවේදයන් අනුගමනය කර අත්‍යාවශ්‍ය පරීක්ෂාවන් සිදුනොකර හා ලිපි ලේඛනයන් ලබාගැනීමකින් ද තොරව අවිධිමත් ලෙස හා පෞද්ගලික මට්ටමින් මඩකලපුව කැම්පස් ලෙස හා පෞද්ගලික මට්ටමින් මඩකලපුව කැම්පස් ලිමිටඩ් ආයතනයෙහි ව්‍යාපෘති සැලැස්ම අනුමත කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම

(යොමුව - 8.8.2(VII)

9.6.2 ගොඩනැගිලි ඉදිකිරීම් හා සැලසුම් නැවත පරීක්ෂා කර ප්‍රාදේශිය සභාව වෙත අයවිය යුතු ගාස්තු අය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව නෛතිකව කටයුතු කිරීම.
(යොමුව - 8.8.2 (V), 8.8.2(VI))

9.7 කාත්තන්කුඩි නගර සභාව

---

9.7.1 නගර සභා ආඥා පනතට අනනුකූල වන සේ කාත්තන්කුඩි නගර සභාව සතු දේපලක් බදුදීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර සුදුසු පියවර ගැනීම.
(යොමුව - 8.7.1, 8.7.2 )

9.7.2 තක්සේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව හා අවිධිමත් ලෙස නගර සභාව සතු දේපල බදුදීම හේතුවෙන් අදාල බදු කාලය තුල නගර සභාවට අහිමි වී තිබූ රු.8,475,000 ක බදු මුදල හා ඒ සඳහා දණ්ඩනයන් අදාල වේ නම් එම දණ්ඩනයන්ද ඇතුලත්ව සියළු මුදල් අයකර ගැනීම.
(යොමුව - 8.7.5 )

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2020 නොවැම්බර් 24 දින